# වාර්ෂික වාර්තාව 2021

**ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය**

**පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය**
ජයන්ති මාවත, අනුරාධපුර
ශ්‍රී ලංකාව
දුර: +94-25-3230004
ෆැක්ස්: +94-25-2223983

වෙබ් අඩවිය: www.niphm.gov.lk

# පටුන


| | පිටුව |
|---|---|
| පනත සහ නීති | 03 |
| අධිකාරි බලය | 03 |
| දැක්ම | 03 |
| මෙහෙවර | 03 |
| කළමනාකරණ මණ්ඩලය | 04 |
| ආයතනික ව්‍යුහය | 05 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය | 06 |
| කළමනාකරණ කමිටු | 07 |
| සභාපතිතුමාගේ පණිවුඩය | 08 |
| විධායක වාර්තාව | 09 |
| කාර්ය සාධන විශේෂතා | 11 |
| පනත සහ නීති | 14 |
| • පර්යේෂණ ව්‍යාපෘති | 14 |
| • සංවර්ධන ව්‍යාපෘති | 27 |
| • තාක්ෂණය පැවරීමේ ක්‍රියාකාරකම් | 36 |
| • උපදේශන සේවා | 39 |
| • පරීක්ෂණාගාර සේවා | 40 |
| ධාරිතා වර්ධනය සහ ඵලදායිතා සංවර්ධනය | 41 |
| සම්මාන සහ පිළිගැනීම් | 43 |
| සමාජ, සුබසාධන සහ ආගමික ක්‍රියාකාරකම් | 45 |
| මානව සම්පත් | 46 |
| විධායක කාර්ය මණ්ඩලය | 48 |

## පනත සහ නීති

කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික පසු අස්වනු කළමනාකරණය ආයතනය (පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය) සියලුම කෘෂිකාර්මික භෝග පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1137/10 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් 2000 වර්ෂයේ ජූනි මස 19 දින පිහිටුවන ලදී. 1976 වර්ෂයේදී FAO/UNDP සහාය ඇතිව පිහිටුවන ලද වී අලෙවි මණ්ඩලයේ අනුරාධපුර පිහිටි සහල් සැකසීමේ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයෙහි (RPRDC) කාර්යයන් අලුතින් ස්ථාපනය කරන ලද ආයතනය විසින් පවරාගනු ලැබිණි. සහල් සහ ධාන්‍ය පිළිබඳව පමණක් නොව එළවළු, පලතුරු, කුළුබඩු සහ කැපූ මල් වැනි වෙනත් ක්ෂේත්‍ර භෝග පිළිබඳවද පසු අස්වනු පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීමේ කාර්යයන් සහ වගකීම්ද අලුතින් පිහිටුවන ලද ආයතනයට පවරා දෙන ලදී. ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 2093/26 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් 2018.10.27 දින ආයතනයේ නම ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය ලෙස වෙනස් කරන ලදී.

**අධිකාරී බලය**

ගැසට් නිවේදනයේ දැක්වෙන විධිවිධානයට අනුව, ශ්‍රී ලංකාවේ පසු අස්වනු තාක්ෂණ සංවර්ධනය කිරීම සඳහා පර්යේෂණ අවශ්‍යතා හඳුනාගැනීම සහ ප්‍රමුඛකරණය කිරීම සහ වැඩසටහන් ක්‍රියාවට නැංවීමේ කාර්යය සඳහා අදාළ සියලු නියෝජිතායතන ඒකරාශී කිරීමේ සම්බන්ධීකරණ ආයතනය ලෙස ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය කටයුතු කළ යුතු වේ.

**දැක්ම**

ජාතික ආහාර සුරක්ෂිතතාවය සඳහා තිරසර පසු අස්වනු සංවර්ධනයේ විශිෂ්ටත්ව කේන්ද්‍රස්ථානය වීම.

**මෙහෙවර**

තරගකාරී මිලකට දේශීය සහ අපනයන වෙළෙඳපොළ අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස කෘෂිකාර්මික අස්වැන්න සහ නිෂ්පාදනවල සැපයුම් සහ අගය දාම ශක්තිමත් කිරීම සඳහා ඵලදායී සහ කාර්යක්ෂම පසු අස්වනු තාක්ෂණික මැදිහත්වීම් මඟින් ජාතික ආහාර සුරක්ෂිතතාවය තිරසර ලෙස සංවර්ධනය කිරීම.

## කළමනාකරණ මණ්ඩලය

2021 දෙසැම්බර් 31 වැනි දිනට

**සභාපති**

මහාචාර්ය ඩබ්ලිව්.ඒ.පී. වීරක්කොඩි මහතා

**උප සභාපති**

ඩබ්ලිව්.එම්. මංජුල හිරෝෂණ මහතා

**සාමාජිකයන්**

ආචාර්ය එස්.එච්.එස්. අජන්ත ද සිල්වා මහතා
එස්.ඒ. ශ්‍රියාණි මිය
සරත්චන්ද්‍ර ද සිල්වා මහතා

**අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්**
ඉංජි. එච්.එම්.ඒ.පී. රත්නායක මහතා

## ආයතනික ව්‍යුහය

### අනුමත බඳවාගැනීමේ පටිපාටිය (SOR) අනුව ආයතනික ව්‍යුහය



2018 වර්ෂයේදී ආයතනය මතු දක්වා ඇති පරිදි එහි අංශ ප්‍රතිව්‍යුහගත කරන ලදී. (මුළු සේවක සංඛ්‍යාව ආයතනික ව්‍යුහය සහ ප්‍රතිව්‍යුහගත කරමින් පවතී)

1. පර්යේෂණ අංශය
2. ඉංජිනේරු අංශය
3. තාක්ෂණ පැවරීම් අංශය
4. සංවර්ධන ව්‍යාපෘති අංශය
5. පරීක්ෂණාගාර සේවා අංශය
6. සැලසුම් සහ අධීක්ෂණ අංශය
7. පරිපාලන අංශය
8. මූල්‍ය අංශය
9. ශාස්ත්‍රීය අංශය
10. අභ්‍යන්තර විගණන අංශය

# ජොෂ්ඨ කළමනාකාරිත්වය

2021 දෙසැම්බර් 31 වැනි දිනට

**අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි (වැඩබලන)**

ඉංජි. එච්.එම්.ඒ.පී. රත්නායක මහතා

**අතිරේක අධ්‍යක්ෂ (පර්යේෂණ සහ තාක්ෂණ පැවරීම්)**
ඉංජි. එච්.එම්.ඒ.පී. රත්නායක මහතා

**අතිරේක අධ්‍යක්ෂ (පරිපාලන සහ මූල්‍ය)**
ආර්.කේ.ඒ.පී. රාමනායක මහතා

**පර්යේෂණ අංශය**
ආචාර්ය ආර්.එම්.එන්.ඒ. විජේවර්ධන මිය
දෙ. ප්‍රධානි | ප්‍රධාන පර්යේෂණ නිලධාරි

**ඉංජිනේරු අංශය**
ඉංජි. බී.ඩී.එම්.පී. බණ්ඩාර මහතා
දෙ.ප්‍රධානි | ජොෂ්ඨ යාන්ත්‍රික ඉංජිනේරු

**තාක්ෂණ පැවරීමේ අංශය**
ඩබ්ලිව්.එම්.සී.බී. වාසල මහතා
දෙ.ප්‍රධානි (වැඩබලන) | ප්‍රධාන පර්යේෂණ නිලධාරි

**ව්‍යාපෘති කළමනාකරණ අංශය**
ඩබ්ලිව්.එම්.සී.බී. වාසල මහතා
දෙ. ප්‍රධානි | ප්‍රධාන පර්යේෂණ නිලධාරි

**පරීක්ෂණාගාර සේවා අංශය**
සී.ආර්. ගුණවර්ධන මහතා
දෙ.ප්‍රධානි | ජොෂ්ඨ පර්යේෂණ නිලධාරි

**සැලසුම් සහ අධීක්ෂණ අංශය**
ආචාර්ය ආර්.එම්.ආර්.එන්.කේ. රත්නායක මිය
දෙ.ප්‍රධානි | ජොෂ්ඨ පර්යේෂණ නිලධාරි

**ශාස්ත්‍රීය අංශය**
ආචාර්ය ඩී.එම්.එස්.පී. බණ්ඩාර මිය
දෙ.ප්‍රධානි | ජොෂ්ඨ යාන්ත්‍රික ඉංජිනේරු

**පරිපාලන අංශය**
ආර්.කේ.ඒ.පී. රාමනායක මහතා
දෙ.ප්‍රධානි | අතිරේක අධ්‍යක්ෂ (පරිපාලන සහ මූල්‍ය)

**අභ්‍යන්තර විගණන අංශය**
ආර්.එම්.ඩී. රත්නායක මහතා
දෙ.ප්‍රධානි | අභ්‍යන්තර විගණක

**මූල්‍ය අංශය**
අයි.එම්.එන්.පී. ඉලංගසිංහ මහතා
දෙ.ප්‍රධානි | ගණකාධිකාරි

## කළමනාකරණ කමිටු

2021 දෙසැම්බර් 31 වැනි දිනට

**විගණන සහ කළමනාකරණ කමිටුව**

| නම | තනතුර |
|---|---|
| එස්.ඒ. ශ්‍රියාණි මිය | සභාපති |
| ආචාර්ය එස්.එච්.එස්.ඒ. ද සිල්වා මහතා | සාමාජික |
| සරත්චන්ද්‍ර ද සිල්වා මහතා | සාමාජික |
| ඉංජි. එච්.එම්.ඒ.පී. රත්නායක මහතා | ලේකම් |
| ආර්.එම්.ඩී. රත්නායක මහතා | කැඳවුම්කරු |
| ජේ.ඒ.එස්.ඩී. පෙරේරා මහතා | නිරීක්ෂක |
| යූ.එස්.එල්. කුමාර මහතා | නිරීක්ෂක |

**පර්යේෂණ සහ උපදේශන කමිටුව**

| නම | තනතුර සහ ස්ථානය |
|---|---|
| ආචාර්ය අජන්ත ද සිල්වා මහතා | අතිරේක ලේකම්, කෘෂිකර්ම තාක්ෂණ අංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය. |
| මහාචාර්ය එස්.බී. නවරත්න මහතා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ව්‍යවහාරික විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. |
| ආචාර්ය රෝහිත ප්‍රශාන්ත මහතා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කෘෂිවිද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. |
| ආචාර්ය ජේ.ඩබ්ලිව්. දමුණුපොළ මහතා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. |
| මහාචාර්ය එල්. සූරියගොඩ මහතා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කෘෂිවිද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. |
| මහාචාර්ය සනත් අමරතුංග මහතා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කෘෂිවිද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. |
| නීලමණී යාපා මෙනවිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ව්‍යවහාරික විද්‍යා පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, |
| හරිදාස් ප්‍රනාන්දු මහතා | සමූහ සාමාන්‍යාධිකාරී (කෘෂි ව්‍යාපාර). කාගිල්ස් සිලෝන් පීඑල්සී |
| මහාචාර්ය කේ.එච්. සාරානන්ද මහතා | කෘෂිවිද්‍යා හා වැවිලි කළමනාකරණ පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය |
| ආචාර්ය එස්.ඩී.ජී.එස්.පී ගුණවර්ධන මහතා | අතිරේක ලේකම්, කෘෂිකර්ම තාක්ෂණ අංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය. |

**පර්යේෂණ නිකුත් කිරීමේ කමිටුව**

| නම | තනතුර |
|---|---|
| ආචාර්ය ආර්.එම්.එන්.ඒ. විජේවර්ධන මිය | සභාපති |
| ජී.ඩී.එන්. මැණිකේ මිය | ලේකම් |
| ඩබ්ලිව්.එම්.සී.බී. වාසල මහතා | සාමාජික |
| බී.ඩී.එම්.පී. බණ්ඩාර මහතා | සාමාජික |
| ආර්.එම්.ආර්.එන්.කේ. රාමනායක මිය | සාමාජික |

## සභාපතිවරයාගේ පණිවුඩය

කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය (පෙර පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය - IPHT-), රටේ ආහාර සුරක්ෂිතතාව ඉහළ නැංවීමේ අරමුණින් පසු අස්වනු අංශයේ සියලුම ක්ෂේත්‍ර ආවරණය කරයි. ධාන්‍ය, මාෂ භෝග, තෙල් බීජ, අනෙකුත් ක්ෂේත්‍ර භෝග, පලතුරු, එළවළු, කුළුබඩු භෝග සහ විසිතුරු ශාක සම්බන්ධයෙන් පසු අස්වනු පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීමේ කාර්යය සඳහා 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ විධිවිධාන යටතේ අංක 1137/10 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් 2000 ජුනි 19 වැනි දින IPHT පිහිටුවන ලදී. 2018.10.27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2093/26 අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ආයතනයේ නම ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය ලෙස වෙනස් කරන ලදී

කාර්ය මණ්ඩලය ඔවුන්ගේ ප්‍රවාහනය සහ කණ්ඩායම් වැඩ කිරීමේදී මුහුණ දෙන ලද අභියෝග සම්බන්ධයෙන් 2021 වර්ෂය පෙර වසරට වඩා වෙනසක් නොවීය. මීට අමතරව 2021 අප්‍රේල් මස ආරම්භ කරන ලද ජාතික කාබනික කෘෂිකාර්මික වැඩසටහන NIPHM වැඩසටහන්වලට බලපෑම් ඇති කරමින් බොහෝ වාණිජ බෝග පද්ධතිවල ගොවිතැන් භාවිතයන්වලට බලපාන ලදී. කොවිඩ් වසංගතය මධ්‍යයේ වුවද පසු අස්වනු අංශයේ ගැටලු විසඳීම සඳහා පර්යේෂණ සහ සංවර්ධන කටයුතු කරගෙන යාම අපගේ ප්‍රධාන අභියෝගය විය. කෙසේවෙතත්, ජාතික ආහාර සුරක්ෂිතතාව සහතික කිරීමේ අරමුණින් 2021 වර්ෂය තුළ රාජ්‍ය අරමුදල් සහිත පර්යේෂණ ව්‍යාපෘති 13ක්, රාජ්‍ය අරමුදල් සහිත සංවර්ධන ව්‍යාපෘති 09ක් සහ විදේශ අරමුදල් සහිත පර්යේෂණ ව්‍යාපෘති 01ක් සාර්ථකව සිදු කිරීමට ආයතනයට හැකි විය. මෙම සියලු ව්‍යාපෘති මඟින් ආර්ථික වශයෙන් වැදගත් කෘෂිකාර්මික භාණ්ඩවල සැපයුම් සහ අගය දාමයේ ප්‍රධාන ගැටලු ආමන්ත්‍රණය කරන ලදී. තීරණාත්මක අලාභ ලක්ෂ්‍යවල පවතින හිඩැස් ආමන්ත්‍රණය කිරීම තුළින් කෘෂිකාර්මික භෝගවල සැපයුම් සහ අගය දාමයන් වැඩිදියුණු කිරීම හරහා පසු අස්වනු හානි අවම කර ගැනීම සඳහා තාක්ෂණයන් සංවර්ධනය කිරීම කෙරෙහි මෙම සියලු පර්යේෂණ ව්‍යාපෘති ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලදී.

සංවර්ධන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ගත් විට සහල්, ධාන්‍ය, රනිල භෝග, පලතුරු, එළවළු සහ කුළුබඩු භෝගවල නිසි පසු අස්වනු භාවිතයන් විශේෂයෙන් සහනාධාර තාක්ෂණ හුවමාරු වැඩසටහන් සහ දැනුවත් කිරීමේ සංවර්ධන හරහා සැපයුම් දාමයන් වෙත හඳුන්වා දෙන ලදී. ප්‍රමාණාත්මකව සහ



ගුණාත්මකව පසු අස්වනු හානි අවම කිරීමේ ප්‍රධාන කරුණ ලෙස ප්‍රවාහන ක්‍රම හඳුනාගෙන ඇති බැවින්, 'පලතුරු සහ එළවළු හැසිරවීම සහ ප්‍රවාහනය සඳහා ආරක්ෂිත පැකේජ හඳුන්වාදීම' පිළිබඳ සංවර්ධන ව්‍යාපෘතිය 2021 වර්ෂයේදීද අඛණ්ඩව ක්‍රියාත්මක විය.

අනෙකුත් රාජ්‍ය ආයතන හා සසඳන විට, සියලුම පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති සියල්ලක්ම පාහේ මෙන්ම පුහුණු සැසි ගණනාවක්ම පවත්වමින් වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් 70-90%ක් දක්වා වියදම් කිරීමට NIPHM හට අවස්ථාව ලැබිණි. මෙයට අමතරව අත්‍යවශ්‍ය සේවක තනතුරු පිරවීම, වත්කම් නඩත්තු කිරීම (ප්‍රාදේශීය කාර්යාල ඇතුළුව), පුස්තකාල පහසුකම් වැඩිදියුණු කිරීම, කාර්යාල ජාලය ප්‍රතිව්‍යුහගත කිරීම සහ කාලයක සිට නොවිසඳී තිබූ ගැටලු නිරාකරණය කිරීම ආයතනය විසින් වාර්තා කරන ලද අනෙකුත් වැදගත් ප්‍රගතියක් වේ.

අවසාන වශයෙන්, මෙම ක්‍රියාකාරකම්වල සාර්ථකත්වයත් සමඟ පසු අස්වනු හානි අවම කිරීම අපේක්ෂා කරන අතර එය ජාතිය නඟා සිටුවීමේ දී රටේ කෘෂිකර්මාන්තයට කැපී පෙනෙන බලපෑමක් ඇති කිරීමට හේතු වනු ඇත.
2021 වර්ෂය තුළ ලබාගත් අත්දැකීම් මත පදනම්ව, ඉදිරි වසරවලදී පසු අස්වනු කර්මාන්තය වැඩිදියුණු කිරීමට ආයතනයට හැකි වනු ඇතැයි මම විශ්වාස කරමි.

**මහාචාර්ය ඩබ්ලිව්.ඒ.පී. වීරක්කොඩි**
සභාපති

## වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්වල සාරාංශය

2021 වර්ෂයේ සිදු කරන ලද සියලුම ක්‍රියාකාරකම් 2030 වනවිට තිරසර සංවර්ධන අභිමතාර්ථ (SDG) සාක්ෂාත් කර ගැනීම, ***එනම් අභිමථාර්තය 2:*** කුසගින්න නිමා කිරීම, ආහාර සුරක්ෂිතතාව සහ වැඩිදියුණු වූ පෝෂණය සාක්ෂාත් කිරීම සහ තිරසර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම, *අභිමථාර්තය **12:*** තිරසර පරිභෝජනය සහ නිෂ්පාදන රටාව සහතික කිරීම සඳහා සෘජුවම සම්බන්ධ විය.
මෙම අභිමතාර්ථ දෙක සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතනය විසින් යෝජනා කරන ලද වැඩසටහන් සහ ව්‍යාපෘති SDG ***ඉලක්කය 1:*** දරිද්‍රතාවය තුරන් කිරීම සාක්ෂාත් කර ගැනීමටද හේතු විය.

### ව්‍යාප්ත කිරීම සඳහා සූදානම් පසු අස්වනු තාක්ෂණයන්...



පර්යේෂණ ව්‍යාපෘති 13 ක් පවත්වන ලද අතර පර්යේෂණ තුළින් දියුණු කරන ලද සමහර තාක්ෂණයන් ක්ෂේත්‍රයට හඳුන්වාදෙමින් පවතී/හඳුන්වාදීමට සූදානම්ව පවතී.



### පලතුරු සහ එළවළු හැසිරවීමේදී සහ ප්‍රවාහනයේදී පසු අස්වනු හානි අවම කිරීම



ප්‍රවාහනයේදී පසු අස්වනු හානි 10% කින් අඩු කළ හැකි නම්, වාර්ෂිකව රු. මි. 5800ක් ඉතිරි කර ගත හැක

2021 දී, සැපයුම් දාමයේ සියලුම පාර්ශවකරුවන්ට; වගාකරුවන්, එකතුකරන්නන්, ප්‍රවාහනය කරන්නන්, තොග වෙළෙන්දන් සහ සිල්ලර වෙළෙන්දන්ට ප්ලාස්ටික් කූඩ 31240 ක් ලබා දෙන ලදී.

සංවර්ධන ව්‍යාපෘති 9ක් ක්‍රියාත්මක කරන ලද අතර ක්ෂේත්‍රයේ නිසි පසු අස්වනු තාක්ෂණය ක්‍රියාත්මක කරන ලදී. මෙම කෘෂි සැකසුම් කර්මාන්ත පිහිටුවීම හරහා ආදායම් උත්පාදනය කරනු ලබන ස්වයං රැකියා ආරම්භ කරන ලදී.

- **ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීම සඳහා සහල්, බඩඉරිඟු සහ ධාන්‍ය වර්ග ගොවිපොළ තුළ ගබඩා කිරීමේ පහසුකම් සංවර්ධනය කිරීම**



**ගොවිපල තුළ ගබඩා කිරීම් 68ක් වැඩිදියුණු කරන ලදී**

- **ගෘහ මට්ටමේ සහල් සැකසුම් කර්මාන්තය දියුණු කිරීම**



ප්‍රධාන වී වගා කරන ප්‍රදේශවල සහල් සැකසුම් ඒකක 77ක් ස්ථාපනය කරන ලදී

**තෝරාගත් කෘෂිකාර්මික ආහාර භෝගවල පසු අස්වනු හානිය තක්සේරු කිරීම**

ක්ෂේත්‍රයේ නිසි පසු අස්වනු භාවිතයන් ක්‍රියාත්මක කිරීමෙන් පසු අස්වනු හානිය සැලකිය යුතු ලෙස අඩු කර ඇත. එබැවින් පසු අස්වනු හානි පිළිබඳ වත්මන් සංඛ්‍යාලේඛන යාවත්කාලීන කිරීම ඉතා වැදගත් වේ. අඹ සැපයුම් දාමවල වත්මන් පසු අස්වනු අලාභය (NIPHM මඟින් වැඩිදියුණු කරන ලද සැපයුම් දාම) 40% සිට 7% දක්වා අඩු වී ඇති බව මෑතකදී සිදු කරන ලද අධ්‍යයනවල ප්‍රතිඵලවලින් හෙළි වී ඇත.

# විධායක වාර්තාව

2021 වර්ෂය ආයතනයට ඉතා අභියෝගාත්මක වර්ෂයක් විය. ආයතනයේ සියලුම ප්‍රධාන ක්‍රියාකාරකම්; පර්යේෂණ, සංවර්ධන ව්‍යාපෘති, තාක්ෂණ පැවරීම් ක්‍රියාකාරකම්, උපදේශන, පරීක්ෂණාගාර සහ ඉංජිනේරු සේවා කොවිඩ් වසංගතය මධ්‍යයේ වුවද සම්පූර්ණ කිරීමට සිදු විය. කෙසේවෙතත්, සුළු අපගමනයක් සහිතව සැලසුම් කර තිබූ සියලුම කටයුතු පාහේ අවසන් කිරීමට ආයතනයට හැකි විය. එම ප්‍රධාන ක්‍රියාකාරකම් රටේ පලතුරු හා එළවළු අංශය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් කෘෂිකාර්මික භෝගවල සැපයුම් සහ වටිනාකම් දාම කළමනාකරණ භාවිතයන් වැඩිදියුණු කිරීම සඳහා පෙළගැසී ඇත. තවද, මෙම සියලු ක්‍රියාකාරකම් 2030 වනවිට තිරසර සංවර්ධන අභිමතාර්ථ (SDG) සාක්ෂාත් කර ගැනීම සඳහා ඍජුවම සම්බන්ධ විය, එනම් අභිමතාර්ථය 2: කුසගින්න නිමා කිරීම, ආහාර සුරක්ෂිතතාව සහ වැඩිදියුණු කළ පෝෂණය සහ තිරසර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම, අභිමතාර්ථය 12: තිරසර පරිභෝජනය සහ නිෂ්පාදන රටාව සහතික කිරීම. තවද මෙම ක්‍රියාකාරකම් SDG අභිමතාර්ථය 1: දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා විසඳුම් ඉදිරිපත් කරයි. මේ අනුව, 'ජාතික ආහාර සුරක්ෂිතතාව සඳහා තිරසර පසු අස්වනු සංවර්ධනයේ විශිෂ්ටත්ව කේන්ද්‍රස්ථානය වීම' යන ආයතනයේ දැක්ම කරා පිය නැගීමට අපට හැකි විය.

**පර්යේෂණ**

පසු අස්වනු කර්මාන්තය මුහුණ දෙන තාක්ෂණික හා සමාජ ආර්ථික ගැටලු විසඳීම උදෙසා ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන ඉලක්ක කර ඇත. වර්ෂය තුළ පර්යේෂණ ව්‍යාපෘති 25 ක් සිදු කරන ලදී. එය කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් 'ජාතික ආහාර නිෂ්පාදන ධාවකය' යටතේ අරමුදල් සපයන සහ 2020 වර්ෂයේ සිට සිදු කරමින් පවතින පර්යේෂණ ව්‍යාපෘති 04කින්, 2021 වර්ෂයේ ආරම්භ කරන ලද පර්යේෂණ ව්‍යාපෘති 09කින් සහ පෞද්ගලික අංශයේ අරමුදල් ලැබූ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව පර්යේෂණ ව්‍යාපෘති 04කින් සමන්විත විය. ඊට අමතරව විවිධ විශ්වවිද්‍යාලවල උපාධි අපේක්ෂකයන් විසින් පර්යේෂණ ව්‍යාපෘති 08ක් පවත්වන ලද අතර ඒවා ආයතනයේ පර්යේෂණ නිලධාරින්, ව්‍යාප්ති නිලධාරින් සහ ඉංජිනේරුවන් විසින් අධීක්ෂණය කරන ලදී.



කෙසෙල්වල පසු අස්වනු හානි ඇගයීම

තවද, "පසු අස්වනු හානිවලට අදාළ හරිතාගාර වායු ප්‍රමාණනය කිරීම සඳහා වන ශ්‍රී ලංකාවේ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම" යන මැයෙන් විදේශීය අරමුදල් සහිත එක් පර්යේෂණ ව්‍යාපෘතියක්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ පර්යේෂණ කණ්ඩායමක් සමඟ සහයෝගීත්ව පර්යේෂණ ව්‍යාපෘතියක් ලෙස පවත්වන ලදී.

**සංවර්ධන ව්‍යාපෘති**

කෘෂි ව්‍යාපාර සංවර්ධනය සහ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් තාක්‍ෂණ භාවිතය සහ පසු අස්වනු කර්මාන්තය කෙරෙහි ඒවායේ බලපෑම සහතික කිරීම පිණිස සංවර්ධන ව්‍යාපෘති ආයතනය විසින් සිදු කරනු ලැබේ. 2021 වර්ෂය තුළ ආයතනය මඟින් සංවර්ධන ව්‍යාපෘති 9ක් පවත්වන ලදී.




ගොවීන්ගෙන් තොරතුරු රැස් කිරීම: ව්‍යාපෘතිය - පලතුරු සහ එළවළු සඳහා තාක්ෂණික වශයෙන් පරිපූර්ණ ප්‍රාදේශීය බෙදාහැරීමේ ජාලයක් සංවර්ධනය කිරීම

**තාක්ෂණය පැවරීමේ ක්‍රියාකාරකම් (පුහුණු සහ ව්‍යාප්ති)**

සැපයුම් දාමයේ සහ අගය දාම ක්‍රියාකාරකම්වල ඍජුව හෝ වක්‍රව සම්බන්ධ වී සිටින පාර්ශ්වකරුවන් විශාල සංඛ්‍යාවකට දැනුම යාවත්කාලීන කිරීම සහ ඵලදායී තාක්‍ෂණික භූවමාරු ක්‍රියාකාරකම් සහතික කිරීම මෙම පුහුණු ක්‍රියාකාරකම්වල අරමුණ විය. ගොවීන්, එකතුකරන්නන්, තොග විකුණුම්කරුවන්, සිල්ලර වෙළෙන්දන්, සැකසුම්කරුවන්, ව්‍යාප්ති පුද්ගලයින්, විශ්වවිද්‍යාල සහ අනෙකුත් අධ්‍යාපන ආයතනවල සිසුන් සහ රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානවල ප්‍රතිලාභින් මෙයට ඇතුළත් විය. 2021 වර්ෂය තුළ පුහුණු වැඩසටහන් 75ක් පවත්වන ලද අතර, නිසි පසු අස්වනු තාක්ෂණයන් පිළිබඳව පාර්ශවකරුවන් 1452 දෙනෙකු පුහුණු කරන ලදී. ඊට අමතරව කෘෂි ආශ්‍රිත කර්මාන්ත සඳහා නව ව්‍යවසායකයින් 102ක් හඳුන්වා දුන් අතර මෙම කර්මාන්තවලට කුළුබඩු ආශ්‍රිත නිෂ්පාදන සන්නාම 18ක්, සහල් ආශ්‍රිත නිෂ්පාදන සන්නාම 43ක්, විජලනය කළ පලතුරු නිෂ්පාදන වෙළෙඳ නාම 05ක්, පලතුරු ආශ්‍රිත නිෂ්පාදන වෙළෙඳනාම 32ක් සහ මාෂ භෝග ආශ්‍රිත නිෂ්පාදනකරුවන් 04ක් ඇතුළත් වේ.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, පළාත් සභා, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ සහයෝගිත්වයෙන් අනුරාධපුර පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය සහ කුරුණෑගල, මහනුවර, නුවරඑළිය, අම්පාර, හම්බන්තොට සහ කිලිනොච්චි දිස්ත්‍රික් මධ්‍යස්ථාන මඟින් මෙම කටයුතු දිවයින පුරා සිදු කරන ලදී.



පුහුණු වැඩසටහන්

**උපදේශන සහ වෙනත් සේවාවන්**

NIPHM විසින් පශ්චාත් අස්වනු කර්මාන්තයට ඍජුව හෝ වක්‍රව සම්බන්ධ වන රාජ්‍ය, පෞද්ගලික සහ සමුපකාර අංශයේ ආයතන සඳහා උපදේශන සහ අනෙකුත් සේවාවන් සපයයි. මෙමගින් නව සැකසුම් යන්ත්‍රාගාර ස්ථාපිත කිරීමට, පවතින මෝල් සහ යන්ත්‍රාගාර නවීකරණය කිරීමට සහ සහල් මෝල්කරුවන් සහ අනෙකුත් ආහාර සැකසුම්කරුවන් සිය එදිනෙදා කටයුතුවලදී මුහුණ දෙන තාක්ෂණික ගැටලු විසඳීම සඳහා සේවා ලබා දෙන ලදී. ඔවුන්ගේ ඉල්ලීම පරිදි කවර හෝ කෘෂි ආහාර සැකසුම් කර්මාන්තයක් සඳහා තාක්ෂණික වාර්තාව, ශක්‍යතා වාර්තාව සහ විශේෂ වාර්තා සැකසීමට NIPHM උපකාර විය. විශේෂයෙන් කාර්මික නිෂ්පාදන සහ සැකසුම් මාර්ග යන දෙඅංශයේම තත්ත්ව පාලන ක්‍රියාකාරකම් සඳහා විද්‍යාගාර සහ ඉංජිනේරු සේවා සැපයීමෙන් ආයතනය පාර්ශ්වකරුවන්ට සහාය විය. රසායනාගාර සේවා රසායනික, භෞතික සහ ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක සේවාවන්ගෙන් සමන්විත වේ. ගබඩා ධූමායනය කිරීම පරීක්ෂණාගාර සේවා අංශය මඟින් පාර්ශ්වකරුවන්ට ලබා දෙන තවත් සේවාවකි. ඉංජිනේරු සේවා යන්ත්‍රෝපකරණ/උපකරණ පරීක්ෂා කිරීම සහ ඇගයීම් සහ ක්‍රියාකරු පුහුණුවෙන් සමන්විත වේ. 2021 වර්ෂයේදී දිවයින පුරා පසු අස්වනු කර්මාන්තය සඳහා උපදේශන 21ක් ලබාදීමට ආයතනයට හැකි විය.

**සමාජ, සුබසාධන සහ ආගමික ක්‍රියාකාරකම්**

ආයතනික පාලනය ශක්තිමත් කිරීම ආයතනයේ එක් අරමුණකි. සේවක තෘප්තිය ආයතනයේ වර්ධනයට අත්‍යවශ්‍ය වේ. එබැවින් මෙම අරමුණ සපුරා ගැනීම සඳහා වාර්ෂිකව විවිධ සමාජ, සුබසාධන හා ආගමික වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සංවිධානය කරනු ලැබේ. කෙසේවෙතත්, 2021 වර්ෂයේදී කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ආයතනයට එවැනි ක්‍රියාකාරකම් සිදු කිරීමට නොහැකි විය.

**මූල්‍ය කාර්ය සාධනය**

| විස්තරය | 2020 (රු.මි.) | 2021 (රු.මි.) | වර්ධනය (%) |
|---|---|---|---|
| වර්ෂය සඳහා ඌනතාවය | 4.7 | 2.2 | 53 |
| මුදල් හා සමාන දෑ | 30.8 | 37.6 | 22 |
| මුළු ජංගම වත්කම් | 46.9 | 67.4 | 43.7 |
| මුළු ජංගම බැරකම් | 33.4 | 39.6 | 18.6 |
| ශුද්ධ වත්කම (සමකොටස්) | 273.3 | 373.7 | 36.7 |

**මානව සම්පත් සංවර්ධනය**

කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් වසර ආරම්භයේදී සැලසුම් කළ පරිදි මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කිරීමට නොහැකි වුවද, පර්යේෂණ හා සංවර්ධන කාර්ය මණ්ඩල සාමාජිකයින්ට මාර්ගගත පුහුණු වැඩසටහන් 14කට සහභාගී වීමට හැකි විය.

සමස්තයක් ලෙස ගත් කල 2021 වර්ෂය බොහෝ බාධක මධ්‍යයේ ඉලක්ක සාක්ෂාත් කර ගත් වර්ෂයකි.

**ඉංජි. එච්.එම්.ජී.පී. රත්නායක මහතා**
අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී (වැඩබලන)

## කාර්ය සාධන විශේෂතා

**පර්යේෂණ සහ සංවර්ධන**

පසු අස්වනු කර්මාන්තය මුහුණ දෙන තාක්ෂණික හා සමාජ ආර්ථික ගැටලු විසඳීම සඳහා ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන දිශානත වී ඇත. 2021 වර්ෂය තුළ, ආයතනය විසින් පර්යේෂණ ව්‍යාපෘති විසිපහක් (25) පවත්වන ලදී; ඒ අතරින් පර්යේෂණ ව්‍යාපෘති 04ක් කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් අරමුදල් සපයන ලද අතර ලැබුණු මුළු අරමුදල් ප්‍රමාණය රු.මි.1.6945කි; මහා භාණ්ඩාගාරයෙන් ලබා දුන් ආයතනයේ මූලා ප්‍රතිපාදන යොදා ගනිමින් පර්යේෂණ ව්‍යාපෘති 9ක් පවත්වන ලද අතර ලැබුණු මුළු අරමුදල් ප්‍රමාණය රු.මි. 3.254කි. ශිෂ්‍ය පර්යේෂණ ව්‍යාපෘති ලෙස ව්‍යාපෘති අටක් (08) ක්‍රියාත්මක කරන ලද අතර උපාධි අපේක්ෂකයින් ඔවුන් සමඟ සම්බන්ධ විය. කර්මාන්තවල පවතින ගැටලු විසඳීම සඳහා පර්යේෂණ ව්‍යාපෘති හතරක් (4) පවත්වන ලද අතර ඒවාට අදාළ පෞද්ගලික කර්මාන්ත මඟින් අරමුදල් සපයන ලදී. පර්යේෂණ වැඩසටහනේ විස්තර පහත දැක්වේ.

පර්යේෂණ සොයාගැනීම්, නව තාක්‍ෂණයන් ලෙස පසු අස්වනු අංශය තුළ එහි වැඩිදියුණු කිරීම සඳහා ප්‍රචාරය කිරීමට අමතරව, අධ්‍යයනවල ප්‍රතිඵල සමියුරු සමාලෝචිත ජාතික හා ජාත්‍යන්තර සඟරාවල, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ, විවිධ විශ්වවිද්‍යාල විසින් පවත්වන ලද සම්මන්ත්‍රණවල ප්‍රකාශයට පත් කරන ලදී.

පර්යේෂණ ව්‍යාපෘතිවල සාරාංශය පහත වගුවේ දක්වා ඇත.

| | ව්‍යාපෘති මාතෘකාව | ආරම්භක දිනය | අනුමත අයවැය (2021) | මූල්‍ය ප්‍රගතිය (2021.12.31 දිනට) | | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|
| | | | | රු.මි. | % | |
| 1 | **2020 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ක්‍රියාත්මක වන පර්යේෂණ ව්‍යාපෘති** | | | | | |
| 1.1 | නැවුම් වී සීසුයෙන් පදම් කිරීම මඟින් පාරිභෝගික මනාපය වැඩි දියුණු කිරීම සඳහා බත්වල ඇලෙන සුළු බව අවම කිරීම. | 01.07.2019 | 0.1235 | 0.12293 | 99.53 | 100 |
| 1.2 | කටු අනෝදා (*Annona muricata*) අගය එකතු කළ නිෂ්පාදනවල පෝෂණීය හා ඖෂධීය ගුණ විමර්ශනය කිරීම | 01.09.2019 | 0.01 | 0.009 | 90.6 | 100 |
| 1.3 | ඕසෝන් ප්‍රතිකාරය සමඟ ඒකාබද්ධව කැරට් (*DaucuscorotaL*) සඳහා සෝදන උපකරණයක් සංවර්ධනය කිරීම සහ එහි කාර්ය සාධනය ඇගයීම. | 01.10.2019 | 0.155 | 0.1549 | 99.8 | 85 |
| 1.4 | විජලනය කිරීමේ තාක්ෂණයන්හි ක්‍රියාවලි පරාමිතීන් ප්‍රශස්ත කිරීම මඟින් විජලනය කළ පලතුරුවල ගුණාත්මක ලක්ෂණ වැඩිදියුණු කිරීම. | 01.02.2019 | 1.406 | 1.4056 | 99.97 | 100 |

| 2 | 2021 වර්ෂයේදී ආරම්භ කරන ලද ව්‍යාපෘති | | | | | |
|---|---|---|---|---|---|---|
| 2.1 | තෝරාගත් කෘෂිකාර්මික ආහාර භෝගවල පසු අස්වනු භාවිතයන්වල වර්තමාන තත්ත්වය සහ හානි තක්සේරුව පිළිබඳ අධ්‍යයනය කිරීම. | 01.01.2021 | 1.438 | 0.082 | 5.7 | 55.7 |
| 2.2 | විවිධ පසු අස්වනු අවස්ථාවලදී ආර්ථික විශ්ලේෂණය සහ තෝරාගත් ආර්ථික වශයෙන් වැදගත් ධාන්‍ය ආහාර ගබඩා කිරීමට ගොවීන්ගේ ඇති කැමැත්ත | 01.01.2021 | 0.161 | 0.0152 | 9.44 | 42.9 |
| 2.3 | වඳුරන් සහ මීයන් පලවා හරින උපකරණයක් සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම | 01.01.2021 | 0.033 | 0.003 | 9.09 | 50 |
| 2.4 | වැඩිදියුණු කළ පසු අස්වනු තාක්ෂණ මඟින් රතු ලූනුවල (*Allium cepa L. aggregatum*) පසු අස්වනු හානි අවම කිරීම. | 01.01.2021 | 0.148 | 0.1377 | 93.04 | 43.3 |
| 2.5 | ආහාර නිෂ්පාදන සඳහා තිරිඟු පිටි වෙනුවට කොස් සහ දෙල් පිටි ආදේශ කිරීමේ හැකියාව සහ ඒවායේ ක්‍රියාකාරි ගුණාංග සහ සංවේදක ගුණාංග ඇගයීම | 01.01.2021 | 0.071 | 0.049 | 69.01 | 63.8 |
| 2.6 | තිරිඟු පිටි වෙනුවට *Dioscorea alata* (රාජ අල) පිටි භාවිතා කිරීම සඳහා කාබෝහයිඩ්‍රේට් පැතිකඩ සහ ග්ලූටන් අන්තර්ගතයේ බලපෑම | 01.01.2021 | 0.02 | 0.019 | 95 | 45 |
| 2.7 | සහල් මෝල් සහ අනෙකුත් ආහාර ඇඹරුම් මෝල් පිළිබඳ සමීක්ෂණය | 01.01.2021 | 0.246 | 0.0192 | 7.8 | 70 |
| 2.8 | රටකජු තෙල් නිස්සාරණය සඳහා සැකසුම් මාර්ගයක් නිර්මාණය කිරීම සහ සංවර්ධනය කිරීම | 01.01.2021 | 0.811 | 0.6922 | 85.35 | 88.8 |
| 2.9 | අලිගැට පේර පසු අස්වනු හැසිරවීම සඳහා විද්‍යාව පදනම් කරගත් ප්‍රොටෝකෝලයක් සංවර්ධනය කිරීම | 01.01.2021 | 0.326 | 0.316 | 96.93 | 100 |

**පෞද්ගලික අරමුදල් ලැබූ පර්යේෂණ ව්‍යාපෘති**

1. ශ්‍රී ලංකාවේ කජු පොතු තෙල් නිස්සාරණය සඳහා සැකසුම් මාර්ගයක් නිර්මාණය කිරීම සහ සංවර්ධනය කිරීම. පර්යේෂණ සඳහා උදය ඉන්ඩස්ට්‍රීස් පෞද්. සමාගම විසින් අරමුදල් සපයන ලදී.
2. අඹ සහ පේරවල පසු අස්වනු ගුණාත්මකභාවය මත විවිධ පලතුරු ආවරණවල බලපෑම. ගල්කිරියාගම, දඹේවටන, එල්ලාවල හෝටිකල්චර් (පෞද්.) සමාගම විසින් පර්යේෂණය සඳහා අරමුදල් සපයන ලදී.
3. ආසුැති විජලනයට ලක් කළ පලතුරු කැබලි සකස් කිරීම සහ තත්ත්ව ඇගයීම. ජාඇල, වැලිගම්පිටිය, රෝලන්ඩ් පාක්, අංක 103/59හි සිලෝන් නියුට්‍රියා පෞද්. සමාගම විසින් පර්යේෂණය සඳහා අරමුදල් සපයන ලදී.
4. කිරිවලින් තොර කාබනික සහල් ආශ්‍රිත බීම වර්ග සංවර්ධනය කිරීම. ජාඇල, වැලිගම්පිටිය, රෝලන්ඩ් පාක්, අංක 103/59හි සිලෝන් නියුට්‍රියා පෞද්. සමාගම විසින් පර්යේෂණය සඳහා අරමුදල් සපයන ලදී.

**ශිෂ්‍ය පර්යේෂණ ව්‍යාපෘති**

| අංකය | ශිෂ්‍යාගේ නම | විශ්වවිද්‍යාලය | අධීක්ෂකවරයා | පර්යේෂණ මාතෘකාව |
|---|---|---|---|---|
| 1 | ඒ.එම්.එච්.ජී.එන්.කේ. අබේරත්න | යාපනය | ඩබ්ලිව්.එම්.සී..බී.වාසල මහතා | පේරවල පසු අස්වනු ගුණාත්මකභාවය මත විවිධ පලතුරු ආවරණවල බලපෑම |
| 2 | ඩී.එම්.එස්.එම්.දිසානායක | යාපනය | ඩබ්ලිව්.බී.ඩබ්ලිව්.එම්. ආර්.සී.පී.අලුවිහාරේ මහත්මිය | ශීත වියළන තාක්ෂණය භාවිතයෙන් තෝරාගත් පලතුරු වර්ගවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම |
| 3 | ජී.අයි.පී. ඉහළගම | යාපනය | ආචාර්ය ආර්.එම්.එන්.ඒ.විජේවර්ධන මහත්මිය | මුරුංගා සුපෝෂිත තක්කාලි ආශ්‍රිත සුප් කැටයක් සංවර්ධනය කිරීම |
| 4 | ඩී.ජී.එස්.කේ.ගුණසේකර | රජරට | ආචාර්ය ආර්.එම්.එන්.ඒ.විජේවර්ධන මහත්මිය | අමු මිරිස් සඳහා සුදුසු අඩු උෂ්ණත්ව ගබඩා තත්ත්වයන් සහ සිල්ලර වෙළඳාමට පෙර ප්‍රතිකාරවල තත්ත්වය හඳුනා ගැනීම |
| 5 | ආර්.එම්.පී.එන්.රත්නායක | රජරට | ඩබ්ලිව්.එම්.සී..බී.වාසල මහතා | සූර්ය වාෂ්පීකරණ සිසිලන තාක්ෂණය භාවිතයෙන් අඹ කෘතිමව ඉදවීම |
| 6 | ඒ.එම්.එච්.එස් ශාලින්ද | වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය | ඩබ්ලිව්.එම්.සී..බී.වාසල මහතා | කෙසෙල්වල පසු අස්වනු ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම (කැවෙන්ඩිෂ් කෙසෙල් ප්‍රභේදය භාවිතයෙන්) |
| 7 | බී.එන්.එන්.සිල්වා | ඌව වෙල්ලස්ස | කසුන් හෙට්ටිගේ මහතා | කටු අනෝදා ඇතුළත් ප්‍රෝබයොටික් ශීත කළ යෝගට් සංවර්ධනය කිරීම |
| 8 | යූ.පී.එල්.එම්. ලයනල් | ඌව වෙල්ලස්ස | ආචාර්ය නිලන්ති විජේවර්ධන මහත්මිය | අලිගැට පේර ආශ්‍රිත අතිරේක ආහාරයක් සංවර්ධනය කිරීම |

## පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය

### 2020 වර්ෂයේ සිට සිදු කරමින් පවතින පර්යේෂණ ව්‍යාපෘති

### 1. නැවුම් වී සීඝ්‍රයෙන් පදම් කිරීම මඟින් පාරිභෝගික මනාපය වැඩිදියුණු කිරීම සඳහා බත්වල ඇලෙන සුළු බව අවම කිරීම

අලුතින් අස්වනු නෙළන ලද සහල්වල ඇලෙන සුළු බව ශ්‍රී ලංකාවේ සහල් මෝල්කරුවන්ට සෘජුවම බලපා ඇති ප්‍රධාන ගැටලුවකි. ශ්‍රී ලංකාවේ සහල් මෝල්කරුවන්ගෙන් බහුතරයක් කුඩා පරිමාණ හෝ මධ්‍ය පරිමාණ වේ. අලුතින් අස්වනු නෙළන ලද වී පාරිභෝගිකයන් ප්‍රිය කරන තත්ත්වයට පත් වන තෙක් ස්වභාවික පරිණත වීමේ කාල පරිච්ඡේදය තුළ ගබඩා කර තැබීමේ පහසුකම් සැපයීම සඳහා මෙම ගැටලුව මඟින් සහල් මෝල්කරුවන්ට අමතර පිරිවැයක් එකතු කර ඇත. මෙයට සමගාමීව ගබඩා ඉඩකඩ අවශ්‍යතාවය, කෘමි හානි සහ අධික මෙහෙයුම් සහ නඩත්තු පිරිවැය හේතුවෙන් මෙය ආර්ථිකමය නොවන අංගයක් ලෙස සැලකිය හැකිය. ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනයේ පැවති පාර්ශ්වකරුවන්ගේ රැස්වීම්වලදී මතු වූ ඉල්ලීම් සලකා බැලීමෙන්, කෘත්‍රිම පරිණත කිරීමේ ක්‍රම ලෙස වියළි තාප පිරියම් කිරීම සහ හුමාල තාප පිරියම් කිරීම මඟින් අලුතින් අස්වනු නෙළන ලද වී භාවිතයෙන් පිසූ සහල්වල ප්‍රශස්ත සංවේදක, භෞතික හා රසායනික ගුණ සාර්ථකව ලබා දෙන්නේද යන්න සොයා බැලීම සඳහා මෙම පර්යේෂණ ව්‍යාපෘතිය සිදු කරන ලදී.
අලුතින් අස්වනු නෙළන ලද BG-352 වී වියළි තාප පිරියම් කිරීමට ලක් කිරීම, වියළි තාප පිරියම් කිරීමෙන් පසු සම්මත තැම්බීමේ ක්‍රියාපටිපාටිය, වාෂ්ප තාප පිරියම් කිරීමට ලක් කිරීම සහ වාෂ්ප තාප පිරියම් කිරීමෙන් පසු සම්මත තැම්බීමේ ක්‍රියාපටිපාටිය අනුගමනය කරන ලදී. ප්‍රතිකාර කරන ලද නියැදි භෞතික, රසායනික සහ සංවේදක පරාමිතීන් සඳහා විශ්ලේෂණය කරන ලදී. අලුතින් අස්වනු නෙළන ලද වී ස්වභාවිකව පරිණත වීම සඳහා ගබඩා කර තැබීමේදී එක් මෝල් කරුවෙකුට දැරීමට සිදු වන රු.මි.30 ක් වන වර්තමාන සාමාන්‍ය පිරිවැය අඩු කිරීම අධ්‍යයනයේ අවසන් ප්‍රතිඵලය වේ.

ව්‍යාපෘතිය සඳහා මුළු මුල්‍ය ප්‍රතිපාදන රු.මි. 5.21කි. 2019/07/01 සිට 2021/12/31 දක්වා මුළු වියදම රු.මි. 4.75කි; 2019 ප්‍රතිපාදන සහ වියදම් පිළිවෙලින් රු. මි. 0.013ක් සහ 0.0126කි, 2020 ප්‍රතිපාදන සහ වියදම පිළිවෙලින් රු.මි. 5.07 සහ 4.62 ක් වූ අතර 2021 ප්‍රතිපාදනය සහ වියදම පිළිවෙලින් රු. මි. 0.1235 සහ 0.123 (මුළු මුල්‍ය ප්‍රගතිය 91.32% කි.). මෙම පර්යේෂණයේ සොයාගැනීම් මඟින් වී ගබඩා කර තබා ගැනීමේ පිරිවැය අඩු වන අතර, එමඟින් ගොවීන්ට සහ මෝල්කරුවන්ට වැඩි ප්‍රතිලාභ ලබා දේ. සම්පූර්ණ භෞතික ප්‍රගතිය 100% කි.



වාෂ්ප තාපනය කළ නැවුම් වීවලින් පිසූ බත් නියැදිය

**2. කටු අනෝදා (*Annona muricata*) අගය එකතු කළ නිෂ්පාදනවල පෝෂණීය හා ඖෂධීය ගුණ විමර්ශනය කිරීම**

කටු අනෝදා (*Annona muricata*) ලෝකයේ නිවර්තන සහ උපනිවර්තන කලාපවල සහ ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාව ඇතුළු සංවර්ධනය වෙමින් පවතින රටවල පුළුල් ව්‍යාප්තියක් ඇත. එය වර්ෂය පුරා ඵල දරන ශාකයකි. වර්තමානයේ ශ්‍රී ලාංකිකයන් බොහෝ විට කටු අනෝදා පලතුරු යුෂ ලෙස භාවිතා කරයි. නමුත් කටු අනෝදා වෙතින් විවිධ නිෂ්පාදන පරාසයක් සහ අගය එකතු කිරීමේ ඉතා ඉහළ හැකියාවක් ඇත. එය මිනිසුන් සඳහා පෝෂ්‍යදායී පලතුරක් වන අතර සෞඛ්‍ය ප්‍රතිලාභ රාශියක් ලබා දෙයි.

කටු අනෝදාවලින් අගය එකතු කළ ආහාර නිෂ්පාදන සංවර්ධනය කිරීම සහ සංවර්ධිත ආහාර නිෂ්පාදනවල පෝෂණ අගය විශ්ලේෂණය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. විජලනය කළ කටු අනෝදා කුඩුවල අවපැහැ ගැන්වීම පාලනය කිරීම, කටු අනෝදා පලතුරුවලින් ප්‍රෝබයෝටික් ශීත කළ යෝගට් සකස් කිරීම සහ කටු අනෝදා පත්‍රවලින් ඔසු පැන් සකස් කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අගය එකතු කිරීම් වේ.

අවපැහැ ගැන්වීම පාලනය කිරීම සඳහා විජලනය කළ කටු අනෝදා කුඩු, සිට්‍රික් අම්ලය, ඇස්කෝබික් අම්ලය, සිට්‍රික් + ඇස්කෝබික් (1: 1 අනුපාතය) සහ සෝඩියම් මෙටාබිසල්ෆයිට් මිශ්‍රණය විරංජන ප්‍රතිකාරය සමඟ සහ රහිතව ප්‍රතිකාර කරන ලදී. ඒවා රසායනික ප්‍රතිකාරයක් නොමැති පාලනය සමඟ සංසන්දනය කරන ලදී. හොඳම අවපැහැ ගැන්වීම වැළැක්වීමේ ප්‍රතිකාරය විරංජනය නොකර 0.1% සෝඩියම් මෙටාබිසල්ෆයිට් බව සංවේදක ප්‍රතිඵලවලින් අනාවරණය විය. සකස් කරන ලද කටු අනෝදා කුඩු කිසිදු කල් තබා ගන්නා ද්‍රව්‍යයක් එකතු නොකර සාමාන්‍ය පරිසර තත්ත්වයන් යටතේ සති දොළහක් ගබඩා කර තබා ගත හැකිය.

පරිණත කටු අනෝදා පත්‍ර භාවිතා කර ඔසු පැන් සකස් කරන ලදී. පත්‍ර විජලනය කර කුඩු ලබා ගැනීම සඳහා අඹරන ලදී. සංවේදක ඇගයීමට අනුව, 50% කටු අනෝදා පත්‍ර + 45% හරිත තේ + 5% කුරුඳු කුඩු මිශ්‍රණය හොඳම නිෂ්පාදනය විය.

කිරිවලට කටු අනෝදා පල්ප එක් කර *Bifidobacterium bifidum* සහ *Lactobacillus acidophilus* අඩංගු ප්‍රෝබයොටික් රෝපිතයෙන් පැසවීමෙන් ප්‍රෝබයොටික් ශීත කළ යෝගට් සාදන ලදී. 20% කටු අනෝදා පල්ප එකතු කරන ලද ශීත කළ යෝගට් සංවේදක ඇගයීම අනුව හොඳම නිෂ්පාදනය ලෙස ඇගයීමට ලක් විය. මෙය කිසිදු කල් තබා ගන්නා ද්‍රව්‍යයක් එකතු නොකර ශීත කළ තත්ත්වයන් යටතේ සති අටක් ගබඩා කළ හැකිය. සාමාන්‍ය ශීත කළ යෝගට් හා සැසඳීමේදී කටු අනෝදා ඇතුළත් ශීත කළ යෝගට්වල ප්‍රෝබයොටික් වර්ධනය සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පවතී.

පර්යේෂණ සඳහා මුළු ප්‍රතිපාදන රු.මි. 0.245 ක් වූ අතර මුළු වියදම රු.මි. 0.162කි. (2019 වර්ෂයේ ප්‍රතිපාදනය- රු. මි. 0.00954ක් සහ වියදම් රු.මි. 0.00954කි, 2020 වර්ෂයේ ප්‍රතිපාදනය- රු.මි. 0.225 සහ වියදම රු.මි. 0.143කි, 2021 වර්ෂයේ ප්‍රතිපාදනය- රු.මි. 0.01 සහ වියදම රු.මි. 0.009කි.) මූල්‍ය ප්‍රගතිය 91.34%ක් සහ භෞතික ප්‍රගතිය-100%කි.



ප්‍රීබයෝටික් අන්තර්ගත ශීත කළ කටු අනෝදා යෝගට්

### 3. ඕසෝන් ප්‍රතිකාරය සමඟ ඒකාබද්ධව කැරට් (*DaucuscarotaL*) සඳහා සෝදන උපකරණයක් සංවර්ධනය කිරීම සහ එහි කාර්ය සාධනය ඇගයීම

කැරට් (Daucus carota L.), අර්තාපල් (Solanum tuberosum) සහ රාබු (Raphanus raphanistrum) යනු ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් වැදගත් එළවළු භෝග වන අතර, atroseptica උප විශේෂයේ *Erwinia carotovora* සහ carotovora උප විශේෂයේ *Erwinia carotovora* වැනි බැක්ටීරියා හේතුවෙන් ඇති වන මෘදු කුණුවීම හේතුවෙන් ගබඩා කිරීමේදී ඇති වන අධික පසු අස්වනු හානිය වාණිජ වගාව ආශ්‍රිතව පවතින ප්‍රධාන ගැටලුව වේ. විසඳුමක් ලෙස, භෝග මතුපිට ඇති බැක්ටීරියා සහ අනෙකුත් ක්ෂුද්‍ර ජීවීන් විෂබීජහරණය කිරීමට පූර්ව ප්‍රතිකාරයක් ලෙස ඕසෝන් භාවිතා කිරීමේ හැකියාවක් පවතී. කෙටි අර්ධ ආයු කාලයක් සහිත ඕසෝන් අස්ථායී වේ. ඕසෝන් ඔක්සිජන් සෑදීමට වියෝජනය වේ; එබැවින් ඕසෝන් යොදා ප්‍රතිකාර කරන ආහාර නිෂ්පාදන රසායනික අපද්‍රව්‍යවලින් තොර වේ. ඒ හැරුණු විට එළවළු තේරීම කිරීම, වර්ග කිරීම, කිරා මැන බැලීම සහ වෙළෙඳපොළේ විකිණීමට පෙර පස් සහ වෙනත් ආගන්තුක ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා එළවළු සේදීම අවශ්‍ය වේ. එහෙත්, වර්තමානයේ නොසෝදා හෝ ප්‍රමාණවත් ලෙස නොසෝදා ගොවීන් විසින් සනීපාරක්ෂක නොවන තත්ත්වයෙන් එළවළු වෙළෙඳපොළට රැගෙන ඒම සිදු කරයි. එබැවින් හානි සහ තැලීම්වලින් සිදු වන පසු අස්වනු හානි අවම කර ගත හැකි කාර්යක්ෂම හා ඵලදායී එළවළු සේදීමේ පද්ධතියක් සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය පවතී.

මෙම පර්යේෂණයේ පරමාර්ථය වූයේ එළවළු මතුපිටින් රෝගකාරක සහ අනෙකුත් නිෂ්ක්‍රිය ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ඕසෝන් ප්‍රතිකාර සමඟ ඒකාබද්ධ සෝදන උපකරණයක් සංවර්ධනය කිරීමයි. තෝරාගත් එළවළු වර්ග සැලසුම් කරන ලද සෝදන උපකරණ භාවිතයෙන් සෝදා එම සෝදාගත් එළවළු සඳහා ඕසෝන් ප්‍රතිකාර සිදු කරන ලද අතර එම අත්හදා බැලීම් සාර්ථක ප්‍රතිඵල ලබා දී ඇත. මෙම පර්යේෂණයේ ප්‍රතිඵලය වූයේ එළවළු කාර්යක්ෂමව පිරිසිදු කිරීම සඳහා සෝදන උපකරණක් සහ ඕසෝන් යෙදීමෙන් මෘදු කුණුවීමේ රෝග පාලනය කිරීමේ ප්‍රොටෝකෝලයක් ලබා දීම වන අතර එහි ප්‍රතිඵලය වූයේ මෘදු කුණුවීමේ රෝගය පාලනය කිරීමෙන් සහ හානිවලින් තොරව එළවළු කාර්යක්ෂමව සේදීම මඟින් එළවළුවල කල් තබා ගැනීමේ ආයු කාලය දීර්ඝ කිරීමයි. මෙම පර්යේෂණ සඳහා මුළු මූල්‍ය ප්‍රතිපාදන රු.මි. 0.479 ක් වූ අතර මුළු වියදම රු. මිලියන 0.344කි. (2020 වර්ෂයේ ප්‍රතිපාදනය - රු.මි. 0.324 සහ වියදම රු.මි. 0.190, 2021 වර්ෂයේ ප්‍රතිපාදනය - රු.මි.0.155 සහ වියදම රු.මි. 0.154කි). මූල්‍ය ප්‍රගතිය 71.81% සහ භෞතික ප්‍රගතිය-100%කි.



සංවර්ධනය කරන ලද සේදීමේ උපකරණය

## 4. විජලනය කිරීමේ තාක්ෂණයන්හි ක්‍රියාවලි පරාමිතීන් ප්‍රශස්ත කිරීම මඟින් විජලනය කළ පලතුරුවල ගුණාත්මක ලක්ෂණ වැඩි දියුණු කිරීම

ඉක්මනින් නරක් වීම සහ පලතුරු වාරයේ අධික නිෂ්පාදනය හේතුවෙන් පලතුරු අංශයේ පසු අස්වනු හානිය ඉහළ ය. වියලීම යනු බහුලව භාවිතා වන ආහාර කල් තබා ගැනීමේ ක්‍රමයක් වන අතර එමඟින් පසු අස්වනු හානි අවම කර ගත හැකි අතර පලතුරුවලට අගය එක් කිරීමක් සිදු කළ හැකිය. එහි බහු භාවිතය හේතුවෙන් වියළි පලතුරු සඳහා ලෝකයේ ඉල්ලුම වැඩි වෙමින් පවතී. විටමින්වලින් පිරුණු ඉහළ පෝෂණ අගයක් සහිත වියළි පලතුරු, සෞඛ්‍ය පිළිබඳව දැනුම්වත් ජාත්‍යන්තර වෙළඳපොළෙහි සුපිරි පලතුරු කෙටි ආහාරයක් ලෙස සැලකේ. වර්තමානයේදී විජලන කළ පලතුරු සඳහා වන විභවය වෙන කවරදාටත් වඩා වැඩි ය. පලතුරුවල එන්සයිමික දුඹුරු පැහැ ගැන්වීම වැළැක්වීම සඳහා පූර්ව ප්‍රතිකාර වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. වියළීමේ කාලය අවම කිරීම, රසය සහ ව්‍යුහය වැඩිදියුණු කිරීම, රසය සංරක්ෂණය කිරීම සහ විජලනය කිරීමට පෙර ආහාරවල පෝෂණීය ගුණය ආරක්ෂා කිරීම බොහෝ ආහාර නිෂ්පාදන සඳහා පූර්ව ප්‍රතිකාර කරනු ලැබේ. නමුත් පූර්ව ප්‍රතිකාර ක්‍රම කුඩා හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයින් විසින් පවා සිදු කිරීමට හැකි වන අයුරින් ලාභදායී හා පහසු විය යුතුය. විජලනය කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ විවිධ පරාමිතීන් හසුරුවමින් අපනයන වෙළඳපොළට සුදුසු පරිදි තෝරාගත් පලතුරුවල (අඹ, පැපොල්, කෙසෙල්, පේර, අන්නාසි සහ වරකා) ගුණාත්මක ලක්ෂණ වැඩිදියුණු කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන පරමාර්ථය විය.

වාරය තුළ නිෂ්පාදනය කරන ලද පලතුරු අතිරික්තය ආරක්ෂා කර ගැනීම සඳහා විකල්ප ප්‍රවේශයන් හඳුන්වා දීම, පලතුරු සැපයුම් හා අගය දාමයට අදාළ ගැටලු අවම කිරීම, ශ්‍රී ලංකාවේ විජලනය කළ පලතුරු නිෂ්පාදන පරිභෝජනය සහ වෙනත් ආහාරමය භාවිතයන් ප්‍රචලිත කිරීම, සෞඛ්‍ය සම්පන්න ජාතියක් ගොඩනැගීම සඳහා පලතුරු පරිභෝජනය වක්‍රව ඉහළ නැංවීම සහ විවිධ පරිමාණයේ විජලනය කළ පලතුරු නිෂ්පාදන කර්මාන්තවලට, තාක්ෂණ පැවරීමේ ක්‍රියාකාරකම් හරහා පලතුරු විජලනයට අදාළ නව තාක්ෂණික ක්‍රම සහ ශිල්පීය ක්‍රම හඳුන්වා දීම ව්‍යාපෘති ප්‍රතිදානයන් සහ අපේක්ෂිත ප්‍රතිඵල විය. තෝරාගත් පලතුරු නියැදි ලෙලි ඉවත් කර ඒකාකාර ප්‍රමාණයට පෙති කැපීමෙන් සහ රසායනික ප්‍රතිකාර කිහිපයක් (සෝඩියම් මෙටා බයිසල්ෆයිට් සහ සිට්‍රික් අම්ලය) සහ රසායනික නොවන ප්‍රතිකාර (විරංජන ශිල්පීය ක්‍රම) යෙදීමෙන් පූර්ව ප්‍රතිකාර ක්‍රියාවලීන්ට ලක් කර විජලනය සඳහා සකස් කරන ලදී. එක් එක් පළතුරු අයිතම සඳහා සුදුසු පූර්ව ප්‍රතිකාරය හඳුනාගන්නා ලදී. පෙර සැකසූ පලතුරු නියැදිය විවිධ වියලීමේ ක්‍රමවලට භාජනය කරන ලදී. ප්‍රතිකාර නොකළ (පාලකය) හා සැසඳීමේදී පෙර සැකසූ පලතුරු නියැදිය සියලු සංවේදක ගුණාංග සඳහා ඉහළම ලකුණු ලබා ඇත. අනෙකුත් වියළීමේ ක්‍රමවලට වඩා ශීත වියළනය කළ පලතුරු නියැදිය සංසන්දනාත්මකව හොඳම ගුණාත්මක බව පෙන්නුම් කරයි. කෙසේවෙතත්, ප්‍රාග්ධන පිරිවැය සහ පවත්වාගෙන යෑමේ පිරිවැය ඉතා ඉහළ බැවින් ශීත වියළීම ඉතා මිල අධික වේ. එබැවින් අඩු පවත්වාගෙන යෑමේ පිරිවැය, මධ්‍යස්ථ ප්‍රාග්ධන පිරිවැය සහ හොඳ තත්ත්වයේ නිෂ්පාදනයක් ද නිෂ්පාදනය කළ හැකි වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ සහ මධ්‍යම පරිමාණ පාර්ශ්වකරුවන් සඳහා තාප පොම්ප වියළීම නිර්දේශ කළ හැක. මෙම පර්යේෂණ සඳහා මුළු මුල්‍ය ප්‍රතිපාදන රු.මි. 8.224කි (2019 වර්ෂයේ ප්‍රතිපාදනය රු.මි. 0.470, වියදම රු.මි. 0.416, 2020 වර්ෂයේ ප්‍රතිපාදනය රු.මි. 6.348 සහ වියදම රු.මි. 4.369, 2021 වර්ෂයේ ප්‍රතිපාදනය රු.මි. 1.406 සහ වියදම රු.මි.1.4056). මුළු මුල්‍ය ප්‍රගතිය75.88% සහ භෞතික ප්‍රගතිය-100%කි.



තාප පොම්ප වියළනය භාවිතයෙන් වියළන ලද ගස්ලබු

## 2021 වර්ෂයේ ආරම්භ කරන ලද පර්යේෂණ

### 01. තෝරාගත් කෘෂිකාර්මික ආහාර භෝගවල පසු අස්වනු භාවිතයන්වල වර්තමාන තත්ත්වය සහ හානි තක්සේරුව පිළිබඳ අධ්‍යයනය කිරීම.

පසුගිය දශක දෙක තුළ ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය ඉක්මනින් නරක් වන ද්‍රව්‍යවල පසු අස්වනු අංශය වැඩිදියුණු කිරීම සඳහා විවිධ ක්‍රියාකාරකම් සිදු කරන ලදී. කෙසේවෙතත්, පසු අස්වනු අංශයේ ධනාත්මක වර්ධනයක් ඇති වී තිබේද යන්න නිශ්චය කිරීම සඳහා මෙතෙක් අධ්‍යයනයක් සිදු කර නොමැත. පලතුරු සහ එළවළු සැපයුම් දාමයේ සමස්ත දර්ශනය නියෝජනය කරන වඩාත් සාමාන්‍යකරණය වූ ආකාරයෙන් වර්තමාන පසු අස්වනු භාවිතයන් සහ හානි හඳුනාගැනීම සඳහා මෙම පර්යේෂණය ආරම්භ කරන ලදී.

එබැවින්, පසු අස්වනු කළමනාකරණ ජාතික ආයතනය (NIPHM) විසින් තෝරාගත් කෘෂිකාර්මික ආහාර භෝගවල පවතින පසු අස්වනු භාවිතයන්වල වර්තමාන තත්ත්වය, හානි තක්සේරු කිරීම සහ පළිබෝධනාශක අවශේෂ මට්ටම තීරණය කිරීම පිළිබඳ අධ්‍යයනයක් සිදු කිරීමට සැලසුම් කර ඇත. දත්ත නොපැවතීම හෝ කල් ඉකුත් වී තිබීම හේතුවෙන් තෝරාගත් ධාන්‍ය වර්ග (වී සහ බඩ ඉරිඟු), පලතුරු (පේර, ගස්ලබු, අන්නාසි, අලිගැටපේර, රඹුටන්) සහ එළවළු (කැරට්, මාළු මිරිස්, ගෝවා, තක්කාලි, බීට් රූට්, කරවිල, අමු මිරිස්, මෑ, බටු) සහ ලොකු ලූනු සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. පර්යේෂණය සඳහා 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රතිපාදන (2021) රු.මි.1.438 ක් වූ අතර වියදම රු.මි. 0.082කි. භෞතික ප්‍රගතිය 55%. ව්‍යාපෘති කාලය වර්ෂ 2කි, එනම් 2021 සහ 2022. පර්යේෂණ සඳහා මුළු ප්‍රතිපාදනය රු.මි. 4.892. ව්‍යාපෘති කාලය වර්ෂ 3 යි.





සැපයුම් දාමයේ විවිධ පාර්ශ්වකරුවන්ගේ කණ්ඩායම්වලින් දත්ත රැස් කිරීම

### 02. විවිධ පසු අස්වනු අවස්ථාවලදී ආර්ථික විශ්ලේෂණය සහ තෝරාගත් ආර්ථික වශයෙන් වැදගත් ධාන්‍ය ආහාර ගබඩා කිරීමට ගොවීන්ගේ ඇති කැමැත්ත

අනෙකුත් සංවර්ධිත රටවලට සාපේක්ෂව සංවර්ධනය වෙමින් පවතින රටවල ආහාරමය ධාන්‍යවල පසු අස්වනු හානිය (PHL) වැඩිය. අවිධිමත් අස්වනු නෙලීම, ගොයම් මැඩීම, වියළීම, ගබඩා කිරීම, ප්‍රවාහනය මෙන්ම කෙටීම වැනි හේතු හෝ සාධක කිහිපයක් මෙයට හේතු වේ. ශ්‍රී ලංකාවේ ධාන්‍යවල පසු අස්වනු හානිය 10% සිට 15% දක්වා පරාසයක පවතී. වී ගබඩා කර තැබීමේදී 7.5% ක හානියක් වන අතර එය FAO දත්තවලට අනුව මුළු වී අලාභයෙන් අඩකට ආසන්නය.

මෙය රටට විශාල ආර්ථික පාඩුවක් වන බැවින් සහ ස්වයංපෝෂිතභාවයට බලපාන බැවින්, ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය (NIPHM) සහ තවත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන කිහිපයක් මෙම ධාන්‍යවලින් ගොවියාට සිදු වන අලාභය අවම කර ගැනීම සඳහා මෙන්ම ලාභදායිත්වය ඉහළ නැංවීම සඳහා ගොවීන්ට තම වී සහ අනෙකුත් ධාන්‍ය සුරක්ෂිතව ගබඩා කර ගැනීමට පහසුකම් සැලසීමට උත්සාහ කරයි.

කෙසේවෙතත්, වී සහ අනෙකුත් ධාන්‍යවල ගොවිපොළ මට්ටමේ ගබඩා කිරීම පිළිගත් මට්ටමේ නොමැත. මෙය ණය, ගබඩා ඉඩ, ගබඩා කිරීමේ පිරිවැය, ගබඩා කිරීමට ඇති කැමැත්ත, අවස්ථා පිරිවැය සහ ලාභය වැනි හේතු කිහිපයක් නිසා සිදු විය හැක. ධාන්‍ය ආහාරවල PHL පිළිබඳ ප්‍රමාණවත් අධ්‍යයනයන් ඇතත්, ඉහත සඳහන් හේතු පිළිබඳ අධ්‍යයනයන් සංඛ්‍යාව අඩුය. තවද, එම අධ්‍යයනයන්හි බොහෝ දත්ත යල් පැන ගිය ඒවා වේ. එපමණක් නොව, ශ්‍රී ලාංකික සන්දර්භය සඳහා ධාන්‍ය ආහාර ගබඩා කිරීමට ඇති කැමැත්ත පිළිබඳ දත්ත රැස් කිරීම සඳහා අධ්‍යයනයක් සිදු කර නොමැත. එබැවින්, ධාන්‍ය ආහාර හානිය අවම කිරීම පිණිස නිසි සැලැස්මක් සහතික කිරීම සඳහා සෑම පසු අස්වනු නෙලීමේ අදියරකදීම ගබඩා කිරීම සහ ලාභදායිතාවය පිළිබඳව වර්තමානයේදී පරිපූර්ණ අධ්‍යයනයක් සිදු කිරීම ඉතා වැදගත් වේ. මෙම පසුබිම තුළ, පවතින දත්ත යාවත්කාලීන කිරීම සහ ගබඩා කිරීමට ගොවීන්ගේ කැමැත්ත (WTS), ගබඩා කිරීමේ අවස්ථා පිරිවැය, විවිධ මිල මට්ටම් සහිත ධාන්‍ය ආහාරවල ගොවිපොළ මට්ටමේ ගබඩා කිරීමට බලපාන සාධක සහ සෑම පසු අස්වනු අවස්ථාවකදීම ලාභයේ වෙනස සොයා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. මෙම අධ්‍යයනය සඳහා ආර්ථික වශයෙන් වැදගත් ධාන්‍ය ආහාර ලෙස ධාන්‍ය වර්ග-වී, බඩ ඉරිඟු, ඇඟිලි මෙනේරි සහ මාෂ භෝග වර්ග-සෝයා බෝංචි, උඳු, මුං, කව්පි තෝරා ගන්නා ලදී. තවද, ජාතියේ වී සහ අනෙකුත් ධාන්‍ය වර්ගවල ස්වයංපෝෂිතභාවය සහ ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීමට මෙම පර්යේෂණ අධ්‍යයනය වඩාත් වැදගත් වේ. 2021 වර්ෂයේදී ප්‍රශ්නාවලිය සකස් කරන ලද අතර ඒවා ක්ෂේත්‍රයේ පූර්ව පරීක්ෂාවට ලක් කරන ලදී. ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් 2022 වර්ෂයේදී සිදු කෙරේ. පර්යේෂණය සඳහා 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රතිපාදනය රු.මි. 0.161කි, කෙසේවෙතත්, රටේ පැවති කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් බොහෝ ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සිදු නොකළ බැවින් වියදම් කිරීමක් සිදු නොවීය. භෞතික ප්‍රගතිය 43%කි. ව්‍යාපෘති කාලසීමාව වසර 3කි, එනම් 2021,2022 සහ 2023. පර්යේෂණය සඳහා මුළු ප්‍රතිපාදනය රු.මි. 2.4කි.

## 03. වඳුරන් සහ මීයන් පලවා හරින උපකරණයක් සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම

ජාතික ආහාර සුරක්ෂිතතාවයට තර්ජනයක් වන ප්‍රධානතම සාධකයක් ලෙස කෘෂිකර්මාන්තයේ වියන් මට්ටමේ පළිබෝධ ප්‍රහාර හඳුනාගෙන ඇත. කෘමි පළිබෝධ සහ දිලීර රෝග කාරක හානි අවම කිරීමට බොහෝ පර්යේෂණ සිදු කර ඇතත් වියන් මට්ටමේ පළිබෝධකයන් පාලනය කිරීමට අවම සැලකිල්ලක් දක්වා ඇත. උස් පලතුරු සහ කුළුබඩු ශාකවල වියන වෙත ඍජුවම ළඟා වන වියන් මට්ටමේ පළිබෝධකයන් ක්ෂේත්‍රයේ ඇවිද යන සත්ව පළිබෝධකයන්ට සාපේක්ෂව පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීමට අපහසුම කණ්ඩායම වේ. සත්ව පළිබෝධ ප්‍රහාරවල අනපේක්ෂිත ස්වභාවය හේතුවෙන් අඛණ්ඩ නිරීක්ෂණය සහ සත්ව ප්‍රහාර පාලනය කිරීම ඉහළින්ම නිර්දේශ කෙරේ.
ශ්‍රී ලංකාවේ තත්ත්වය පිළිබඳව සලකා බැලීමේදී උස් වියන් සහිත පලතුරු සහ කුළුබඩු ශාක සඳහා සත්ව පළිබෝධකයන් දැඩි ලෙස බලපෑම් එල්ල කරයි. එසේම, ශ්‍රී ලංකාවේ වියන් මට්ටමේ සත්ව පළිබෝධ ප්‍රහාර සඳහා විසඳුම් ලබා දීම සඳහා වන පර්යේෂණ සාක්ෂි හමු නොවේ. එබැවින් උස් වියන් සහිත පලතුරු ශාකවලට හානි කරන සත්ව පළිබෝධකයන් පලවා හැරීම සඳහා නව තාක්ෂණික උපාය මාර්ගවල අවශ්‍යතාවය හඳුනාගන්නා ලදී.

එබැවින්, ගෙවතුවල, කුඩා පලතුරු වතුවල සහ විශාල ගොවිපොළවල වඳුරන් සහ වවුලන් විසින් සිදු කරන ප්‍රහාර හේතුවෙන් උස් සහ ඍතු අනුව එල හට ගන්නා නිවර්තන පලතුරු විශේෂවල අස්වැන්න, ගුණාත්මකභාවය, මල් පොහොට්ටු සහ අනෙකුත් ශාකමය කොටස්වලට සිදුවන හානිය අවම කිරීම අරමුණු කරගනිමින් මෙම අධ්‍යයනය සැලසුම් කරන ලදී.

තෝරාගත් සතුන් පහසුවෙන් විකර්ෂණය කළ හැකි නිශ්චිත ශබ්ද සහ ආලෝක සංඛ්‍යාත පරාසයන් නිකුත් කරන ස්වයංක්‍රීය ඉලෙක්ට්‍රොනික උපකරණයක් මගින් පලතුරු භෝගවල පසු අස්වනු හානි අවම අධ්‍යයනයේ පරමාර්ථය විය. පර්යේෂණ පැවැත්වීම සඳහා සදාචාරාත්මක අනුමැතිය ලැබීමෙන් පසු, පෙර සිදු කර ඇති අධ්‍යයනයන් සහ වියන් මට්ටමේ පළිබෝධ පාලනය පිළිබඳ යෝග්‍ය ක්‍රම පිළිබඳ තොරතුරු රැස් කිරීම මේ වනවිට සිදු කරමින් පවතී. තවද, මූලාකෘති ඉලෙක්ට්‍රොනික උපාංගයක් සැලසුම් කිරීම සිදු කරමින් පවතී. පර්යේෂණය සඳහා මූල්‍ය 2021 වර්ෂයේ ප්‍රතිපාදනය රු.මි. 0.033 ක් වූ අතර වියදම රු.මි.0.003කි. භෞතික ප්‍රගතිය - 50%. මුළු මූල්‍ය ප්‍රතිපාදනය - රු.මි. 2.83කි. ව්‍යාපෘති කාලය වර්ෂ 3කි, එනම් 2021,2022 සහ 2023.

### 04. වැඩිදියුණු කළ පසු අස්වනු තාක්ෂණ මගින් රතු ලූනුවල (*Allium cepa L. aggregatum*) පසු අස්වනු හානි අවම කිරීම.

ප්‍රධාන වශයෙන් ගබඩා කරන කාලය තුළ පසු අස්වනු හානි ඉහළ යාම හේතුවෙන් රතු ලූනු ගොවීන් අපහසුතාවයට පත් වී ඇති අතර මීළඟ වගා කන්නය සඳහා බීජ ලූනු (බල්බ) සැපයීම සඳහා ගොවීන්ට මාස හයක් පමණ ලූනු ගබඩා කර තැබීමට අවශ්‍ය වේ. එබැවින් රතු ලූනු පසු අස්වනු හානිය අවම කර පසු අස්වනු කල් තබා ගැනීමේ ආයු කාලය වැඩි කිරීමෙන් රතු ලූනු ගොවීන්ගේ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් මෙම පර්යේෂණය සිදු කරන ලදී. පත්‍ර සහිතව සහ රහිතව සෙවන ප්‍රතිකාර කිරීමෙන් පසුව කාමර තත්ත්ව යටතේ ගබඩා කරන ලද ලූනුවල එලදායිත්වය පරීක්ෂා කිරීම සඳහා පූර්ව අත්හදා බැලීම් සිදු කරන ලදී. මාස තුනක ගබඩා කිරීමෙන් පසු පත්‍ර සහිතව සෙවන ප්‍රතිකාරය ලබා දෙන ලද ලූනු සඳහා මුළු හානිය සාපේක්ෂව අඩු විය. මේ වනවිට පසු අස්වනු හානිය අවම කර ගැනීමට සහ කල් තබා ගත හැකි ආයු කාලය දීර්ඝ කිරීමට හොඳම භාවිතය තෝරා ගැනීම සඳහා ප්‍රතිකාර කිරීමේ භාවිතයන් (සෙවන ප්‍රතිකාරය සහ කෘතිම ප්‍රතිකාරය) සහ ගබඩා භාවිතයන් (උෂ්ණත්වය සහ RH) පරීක්ෂා කරමින් පවතී. විශේෂයෙන්ම ගබඩා කර තැබීමේදී කුණු වීමේ හානිය අවම කර ගැනීමෙන් රතු ලූනු ගොවීන්ට සහ වෙළෙඳුන්ට ප්‍රතිලාභ ලැබෙනු ඇත. 2021 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදනය රු.මි. 0.148ක් වූ අත රු.මි. 0.138 ක් වැය කරන ලදී. භෞතික ප්‍රගතිය-43.3%කි. 2019 වර්ෂයේදී ලොකු ලූනුවල පසු අස්වනු හානි අවම කර ගැනීමේ තාක්‍ෂණයක් සංවර්ධනය කිරීම සඳහා පර්යේෂණයක් සිදු කරන ලදී. කෙසේවෙතත්, රතු ලූනුවල රූප විද්‍යාත්මක හා ජානමය වෙනස්කම්වලට අමතරව සියලුම සංස්කෘතික භාවිතයන් වෙනස් බැවින් සංවර්ධනය කරන ලද තාක්‍ෂණය රතු ලූනු සඳහා කෙලින්ම ආදේශ කළ නොහැක. එබැවින් මෙම පර්යේෂණය 2021 දී ආරම්භ කරන ලදී. මුළු මූල්‍ය ප්‍රතිපාදන - රු.මි.0.27කි. ව්‍යාපෘති කාලය වර්ෂ 2කි, එනම් 2021,2022.





අස්වනු නෙළන ලද රතු ලූනු

## 05. ආහාර නිෂ්පාදන සඳහා තිරිඟු පිටි වෙනුවට කොස් සහ දෙල් පිටි ආදේශ කිරීමේ හැකියාව සහ ඒවායේ ක්‍රියාකාරී ගුණාංග සහ සංවේදක ගුණාංග ඇගයීම

ශ්‍රී ලංකාවේ කොස් මදුළු, කොස් ඇට සහ දෙල්වල ඉක්මනින් නරක් වන ස්වභාවය සහ කෙටි කල් තබා ගැනීම හේතුවෙන් සැලකිය යුතු පසු අස්වනු හානියක් පවතින අතර මෙම භෝගවල කල් තබා ගැනීමේ කාලය දීර්ඝ කිරීමේ වර්තමාන අවශ්‍යතාවයක් පවතී. තිරිඟු පිටි වෙනුවට කොස් මදුළු පිටි, කොස් ඇට පිටි සහ දෙල් පිටි භාවිතා කිරීමේ විශාල විභවයක් පවතින අතර එමඟින් අවසන් නිෂ්පාදනයේ පෝෂක අන්තර්ගතය වැඩි කළ හැක. එමෙන්ම එම පිටිවලට අගය එකතු කිරීම ශ්‍රී ලංකාවේ කොස් සහ දෙල් වගා කිරීමට ඉල්ලුමක් ඇති කරනු ඇත. තිරිඟු පිටිවලට කොස් බල්බ පිටි, ඇට පිටි සහ දෙල් පිටි ඇතුළත් කර සංයුක්ත පිටි නිෂ්පාදනය කිරීමේ හැකියාව පිළිබඳව අධ්‍යයනය කිරීම සහ බේකරි අයිතම නිෂ්පාදනය සහ නූඩ්ල්ස් වැනි වෙනත් ගෘහ මට්ටමේ නිෂ්පාදන සිදු කිරීමේදී එහි කාර්ය සාධනය පරීක්ෂා කිරීම සඳහා තිරිඟු පිටි සහ කොස් බල්බ පිටි, කොස් ඇට පිටි සහ දෙල් පිටිවල වඩාත් සුදුසු සංයෝජන අනුපාතය හඳුනාගැනීම යෝජිත පර්යේෂණයේ අරමුණ වේ. මෙම පර්යේෂණය 2022 වර්ෂයේදී ද අඛණ්ඩව සිදු කරනු ලැබේ. පර්යේෂණ සඳහා 2021 වර්ෂයේ මුළු ප්‍රතිපාදනය රු.මි. 0.071ක් වූ අතර වියදම රු.මි. 0.049කි. මුළු මූල්‍ය ප්‍රතිපාදනය - රු.මි. 0.11කි. ව්‍යාපෘති කාලය වර්ෂ 2කි, එනම් 2021 සහ 2022.



කොස් සහ දෙල් පදනම් කරගත් පිටිවලින් නිපදවන නිෂ්පාදන

## 06. තිරිඟු පිටි වෙනුවට *Dioscorea alata* (රාජ අල) පිටි භාවිතා කිරීම සඳහා කාබෝහයිඩ්‍රේට් පැතිකඩ සහ ග්ලූටන් අන්තර්ගතයේ බලපෑම

සාම්ප්‍රදායික අල වර්ග වර්තමානයේ දිවයින පුරා ජනප්‍රිය වෙමින් පවතී. සාම්ප්‍රදායික අල වර්ග අතරින්, රාජ අල (*Dioscorea alata*) සඳහා වැඩි ඉල්ලුමක් ඇති අතර වගාවන් ව්‍යාප්ත වෙමින් පවතී. එය ලා දම් පැහැයකින් යුක්ත වන අතර බොහොමයක් ආහාර සකස් කරන්නන් සහ පාරිභෝගිකයින් ඒ සඳහා කැමැත්තක් දක්වයි. ශ්‍රී ලංකාව තුළ දැනට තිරිඟු පිටි භාවිතා කරන බේකරි සහ අනෙකුත් නිෂ්පාදන සලකා බැලීමේදී කාබෝහයිඩ්‍රේට් පැතිකඩ ඉතා වැදගත් සාධකයක් වන බව ඇගයීම සඳහා කිසිදු පර්යේෂණයක් සිදු කර නොමැත.

මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ පිටි සහ බේකරි කර්මාන්තයේ තිරිඟු පිටි වෙනුවට රාජ අල (*Dioscorea alata*) භාවිතා කිරීමයි. මෙහිදී රාජ අලවල (*Dioscorea alata*) කාබෝහයිඩ්‍රේට් පැතිකඩ සහ ග්ලූටන් අන්තර්ගතය නිශ්චය කර අගය එකතු කළ බේකරි නිෂ්පාදන සංවර්ධනය කිරීමට සහ පිටි හා අගය එකතු කළ බේකරි නිෂ්පාදනවල පෝෂණීය වටිනාකම සොයා ගැනීමට සැලසුම් කර ඇත.



සකස් කරන ලද රාජ අල පිටි

සාම්ප්‍රදායික වායු වියළන යන්ත්‍රයේ සහ තාප පොම්ප වියළන යන්ත්‍රයේ අල විජලනය කිරීමෙන් රාජ අල පිටි සකස් කරන ලදී. සාම්ප්‍රදායික වියළුම් යන්ත්‍රයට සාපේක්ෂව තාප පොම්ප වියළන යන්ත්‍රයේ පිටිවල ගුණාත්මක භාවය උසස් විය. හොඳම විජලන උෂ්ණත්වය සහ කාලය තාප පොම්ප වියළනය තුළ $45^0C$ හි පැය 6ක් විය. වියළීමට පෙර විනාඩි 2-3ක් සිට්‍රික් අම්ලය 0.5% ද්‍රාවණයකින් ප්‍රතිකාර කිරීම මඟින් රාජ අල පිටි දුර්වර්ණ වීම පාලනය කළ හැක. අගය එකතු කළ නිෂ්පාදන සංවර්ධනය කරමින් පවතී. පර්යේෂණය සඳහා 2021 වර්ෂයේ මුළු ප්‍රතිපාදන රු.මි. 0.02 ක් වූ අතර වියදම රු.මි. 0.019කි. භෞතික ප්‍රගතිය - 45%. මූල්‍ය ප්‍රතිපාදනය - රු.මි. 0.475කි. ව්‍යාපෘති කාලය වර්ෂ 3කි, එනම් 2021, 2022 සහ 2023.

## 07. සහල් මෝල් සහ අනෙකුත් ආහාර ඇඹරුම් මෝල් පිළිබඳ සමීක්ෂණය

සහල් මෝල් සහ අනෙකුත් කෘෂි ආහාර ඇඹරුම්හල් ජාතියට ආහාර සැපයීමට වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතර ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථික සංවර්ධනයට සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. එක් එක් දිස්ත්‍රික්කයේ පවතින සහල් මෝල් සහ අනෙකුත් කෘෂි ආහාර ඇඹරුම්හල් සංඛ්‍යාව ප්‍රතිපත්ති සම්පාදකයින්ට, සංවර්ධන ව්‍යාපෘති මෙහෙයවන්නන්ට සහ අදාළ රාජ්‍ය ආයතන සඳහා විවිධ ආකාරවලින් ඉතා වැදගත් වුවද, මෙතෙක් කිසිදු රාජ්‍ය ආයතනයක එවැනි විධිමත් දත්ත නොමැත. නමුත් ක්‍රියාත්මක වීමට සහ ඔවුන්ගේ පැවැත්මට අවශ්‍ය වන බැවින් මෙම මෝල්කරුවන් විවිධ රාජ්‍ය ආයතනවල ලියාපදිංචි වී ඇත. එබැවින් මෙම ව්‍යාපෘතිය යටතේ දැනට පවතින සහල් මෝල් සහ අනෙකුත් කෘෂි ආහාර ඇඹරුම්හල් පිළිබඳව විවිධ ආයතනවලින් දත්ත රැස්කර දත්ත සමුදායක් සැකසීමට නියමිතය. මූලික වශයෙන් සහල් සැකසීමේ ප්‍රධාන දිස්ත්‍රික්ක හතර වන අනුරාධපුරය, පොළොන්නරුව, අම්පාර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල දත්ත රැස්කරනු ලැබේ. මෙම දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 60ක් ඇත. වර්ෂය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 25 කින් දත්ත රැස් කරන ලදී.

පර්යේෂණය සඳහා 2021 වර්ෂයේ මුළු ප්‍රතිපාදනය රු.මි.0.246 ක් වූ අතර වියදම රු.මි. 0.0192කි. භෞතික ප්‍රගතිය - 70%. මුළු මූල්‍ය ප්‍රතිපාදනය - රු.මි. 1.924කි. ව්‍යාපෘති කාලය වර්ෂ 2කි, එනම් 2021 සහ 2022.

## 08. රටකජු තෙල් නිස්සාරණය සඳහා සැකසුම් මාර්ගයක් නිර්මාණය කිරීම සහ සංවර්ධනය කිරීම

රනිල කුලයට අයත් වැදගත් තෙල් බීජ බෝගයක් වන අතර එය හොඳ ප්‍රෝටීන් සහ තන්තු ප්‍රභවයකි. රටකජු තෙල් බොහෝ විට ලොව පුරා සමහර රටවල සෞඛ්‍ය සම්පන්න ආහාරයට ගන්නා තෙල් ලෙස භාවිතා කරයි. රටකජු තෙල් පෝෂ්‍ය පදාර්ථ අතින් ගත් කළ සංතෘප්ත මේද අඩු ප්‍රතිශතයක්, ඒක අසංතෘප්ත සහ බහු අසංතෘප්ත මේද වැඩි ප්‍රතිශතයකින් මෙන්ම අත්‍යාවශ්‍ය විටමින්වලින් වැඩි ප්‍රමාණයක් සහ හොඳ ප්‍රතිඔක්සිකාරක ගුණවලින් යුක්ත වේ. එබැවින් එය ශ්‍රී ලංකාවේ බහුලව භාවිතා වන පොල්තෙල් වෙනුවට ආහාරයට ගත හැකි තෙල් වර්ගයක් ලෙස හඳුන්වා දිය හැකිය. රෙඩ් ස්පැනිෂ්, තිස්ස, වලව, ඉන්දි, ටිකිරි, ANKG1 ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් මොණරාගල, කුරුණෑගල, අම්පාර, බදුල්ල, පුත්තලම සහ රත්නපුර දිස්ත්‍රික්කවල වගා කරනු ලබන ප්‍රධාන රටකජු ප්‍රභේද වේ. යල සහ මහ කන්නවල වාර්ෂික නිෂ්පාදනය ටොන් 27,602 (AgStat 2018) පමණ වේ. නව ප්‍රතිපත්ති ප්‍රකාශය යටතේ වගා කිරීම වැඩි කළ යුතු රටකජු ඇතුළු වැදගත් භෝග 16ක් රජය විසින් හඳුනාගෙන ඇත. එබැවින් ඉදිරි වසරවලදී වාර්ෂික නිෂ්පාදනය වැඩි වන ඇතැයි අපේක්ෂා කෙරේ. එබැවින්, පසු අස්වනු හානි අවම කර ගැනීම මෙන්ම එම අස්වනු නෙළන ලද නිෂ්පාදනවල අගය එකතු කිරීම සම්බන්ධයෙන්ද පසු අස්වනු භාවිතයන් සංවර්ධනය කිරීම පිළිබඳව අපගේ අවධානය යොමු කිරීම වඩාත් වැදගත් වනු ඇත. මේ සම්බන්ධයෙන්, රටකජු වගාව යටතේ තෙල් නිස්සාරණය හඳුන්වාදීම ප්‍රධාන අගය එකතු කිරීමේ නිෂ්පාදනය වන අතර එය නව ප්‍රධාන වෙළෙඳපොළ අවස්ථාවක් ලෙස හඳුන්වා දිය හැකිය. එබැවින්, මෙම පර්යේෂණය හරහා නිස්සාරණය කිරීමේ කාර්යක්ෂමතාව, නිෂ්පාදන පිරිවැය සහ නිස්සාරණ ක්‍රියාවලියේ ධාරිතාව නිශ්චය කිරීම මඟින් දේශීය රටකජු ප්‍රභේදවලින් රටකජු තෙල් නිස්සාරණය කිරීම සඳහා සැකසුම් මාර්ගයක් සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වේ. 2021 වසර අවසානයේදී තෙල් නිස්සාරණ ක්‍රියාවලිය ප්‍රශස්ත කර ඇති අතර තත්ත්ව ඇගයීම සමඟ තවදුරටත් වැඩිදියුණු කිරීම් සිදු වෙමින් පවතී. පර්යේෂණය සඳහා 2021 වර්ෂයේ මුළු ප්‍රතිපාදනය රු.මි. 0.811 ක් වූ අතර වියදම රු.මි. 0.692කි. භෞතික ප්‍රගතිය - 88.8%කි. මුළු මූල්‍ය ප්‍රතිපාදනය - රු.මි. 1.075 කි. ව්‍යාපෘති කාලය වර්ෂ 2කි, එනම් 2021 සහ 2022.





ඉස්කුරුප්පු පීඩන තෙල් නිස්සාරකය මඟින් තෙල් නිස්සාරණය කිරීම සහ නිස්සාරණය කරන ලද රටකජු තෙල් නියැදිය

## 09. අලිගැට පේර පසු අස්වනු හැසිරවීම සඳහා විද්‍යාව පදනම් කරගත් ප්‍රොටෝකෝලයක් සංවර්ධනය කිරීම

ඉක්මනින් නරක් වන ද්‍රව්‍ය ලෙස, අලිගැට පේර (*Persea americana* Mill.) වැනි පලතුරු කෙටි පසු අස්වනු කල් තබා ගැනීමේ කාලයක්, ඉහළ පසු අස්වනු රෝග සහ ඉදවීමට අදාළ ගැටලු පෙන්නුම් කරයි. ඒ හැරුණු විට අලිගැට පේර ආශ්‍රිත දේශීයව නිෂ්පාදනය කරන ලද අගය එකතු කළ නිෂ්පාදන දේශීය වෙළෙඳපොළ තුළ දුර්ලභ වේ. එබැවින් අලිගැට පේරවලින් අගය එකතු කළ නිෂ්පාදන නිපදවීමට, පසු අස්වනු රෝග පාලනය කිරීමට පරිසර හිතකාමී ක්‍රම (අත්‍යවශ්‍ය තෙල් සහ ශාක සාර) සොයා ගැනීමට, අස්වැන්න නෙළීමේ මෙවලමක් සංවර්ධනය කිරීමට සහ අලිගැට පේර සඳහා ඵලදායී ඉදවීමේ ක්‍රමයක් සැකසීමට මෙම පරීක්ෂණය සැලසුම් කර ඇත. පළමු පියවර ලෙස, නිසි ලෙස ඉදවීම සඳහා ප්‍රශස්ත එතෆෝන් සාන්ද්‍රණය සහ නිරාවරණ කාලය සොයා ගන්නා ලදී. මෙය 2021 වර්ෂයේ සිට ආරම්භ වන වසර දෙකක පර්යේෂණයක් වන අතර මුළු අයවැය ප්‍රතිපාදන රු.මි. 2021 වර්ෂය සඳහා 0.326 ක් වූ අතර මුළු වියදම රු.මි.0.316කි. භෞතික ප්‍රගතිය - 100%කි. මුළු මූල්‍ය ප්‍රතිපාදනය- රු. මි.0.625කි. ව්‍යාපෘති කාලය වර්ෂ 2කි, එනම් 2021 සහ 2022.

පල්ප සංරක්ෂණය
Pulp Preservation



Control | Treated with 0.5% Citric

පාලකය | 0.5% සිට්‍රික් අම්ලයෙන් ප්‍රතිකාර කරන ලද

## සංවර්ධන ව්‍යාපෘති

කෘෂි ව්‍යාපාර සංවර්ධනය සහ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් තාක්‍ෂණ භාවිතය සහ පසු අස්වනු කර්මාන්තය කෙරෙහි ඒවායේ බලපෑම සහතික කිරීම සඳහා සංවර්ධන ව්‍යාපෘති ආයතනය විසින් සිදු කරන ලදී. 2021 වර්ෂය තුළ, ආයතනය විසින් රටෙහි කෘෂි පදනම් කර්මාන්ත සංවර්ධනය කිරීමේ ප්‍රධාන ක්ෂේත්‍රවල සංවර්ධන ව්‍යාපෘති 9ක් පවත්වන ලද අතර, එම ව්‍යාපෘති සඳහා වන මුළු මූල්‍ය ප්‍රතිපාදනය රු.මි. 74.6කි. මෙම සියලු ව්‍යාපෘති වර්ෂ 2ක ව්‍යාපෘති ලෙස සැලසුම් කරන ලද අතර, 2022 වර්ෂය දක්වා අඛණ්ඩව සිදු කරනු ලැබේ. සංවර්ධන ව්‍යාපෘතිවල සාරාංශය පහත වගුවේ දක්වා ඇත.

| | ව්‍යාපෘති මාතෘකාව | ආරම්භ කළ දිනය | අනුමත අයවැය (2021) | මූල්‍ය ප්‍රගතිය (2021.12.31 දිනට) | | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|
| | | | | රු.මි. | % | |
| 1.1 | ශ්‍රී ලංකාවේ ඉක්මනින් නරක් වන ද්‍රව්‍ය සැපයුම් දාමයේ පසු අස්වනු හානි අඩු කිරීම සඳහා ආරක්ෂාකාරි ඇසුරුම් සහ ප්‍රවාහන ක්‍රමවේද හඳුන්වාදීම | 01.01.2021 | 49.587 | 49.274 | 99.4 | 97.5 |
| 1.2 | එළවළු සහ පලතුරු සඳහා තාක්ෂණික වශයෙන් දියුණු ප්‍රාදේශීය බෙදාහැරීමේ ජාලයක් සංවර්ධනය කිරීම | 01.01.2021 | 5.45 | 5.31 | 97.4 | 58 |
| 1.3 | ගෘහස්ථ මට්ටමේ සහල් සැකසුම් කර්මාන්ත සංවර්ධනය කිරීම | 01.01.2021 | 4.274 | 4.2055 | 98.4 | 100 |
| 1.4 | ශ්‍රී ලංකාවේ ප්‍රධාන මාෂ භෝග වගා කරන ප්‍රදේශවල මාෂ භෝගවල පොතු ඉවත් කරන ඒකක ස්ථාපිත කිරීම | 01.01.2021 | 2.625 | 2.032 | 77.4 | 65.7 |
| 1.5 | ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීම සඳහා සහල්, බඩ ඉරිඟු සහ ධාන්‍ය වර්ග ගොවිපළ තුළ ගබඩා කිරීමේ පහසුකම් සංවර්ධනය කිරීම | 01.01.2021 | 1.78 | 1.747 | 98.1 | 100 |
| 1.5 | ශ්‍රී ලංකාවේ පලතුරු අගය දාමයේ පාර්ශ්වකරුවන් සවිබල ගැන්වීම සඳහා ද්විතීයික සැකසුම් මධ්‍යස්ථාන පිහිටුවීම | 01.01.2021 | 3.995 | 3.45 | 86.4 | 88.3 |
| 1.6 | ග්‍රාමීය මට්ටමින් කුළුබඩු සැකසීමේ ක්ෂුද්‍ර ව්‍යවසායන් හඳුන්වාදීම | 01.01.2021 | 1.13 | 1.053 | 93.2 | 100 |
| 1.7 | දේශීය අල වර්ග, කොස්, බඩ ඉරිඟු, වට්ටක්කා සහ අනෙකුත් ආහාර භෝග යොදා ගනිමින් අගය එකතු කළ නිස්සාරණ නිෂ්පාදන සංවර්ධනය සඳහා මධ්‍ය පරිමාණ නිස්සාරණ ඒකක පිහිටුවීම | 01.01.2021 | 4.01 | 3.9196 | 97.7 | 76.2 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1.8 | නව නිෂ්පාදන සංවර්ධන (NPD) ක්‍රියාපටිපාටි ශක්තිමත් කිරීම සඳහා සහ නිෂ්පාදන තත්ත්ව වැඩිදියුණු කිරීම සඳහා රසායනාගාර පහසුකම් වැඩිදියුණු කිරීම | 01.01.2021 | 1.8 | 1.7766 | 98.7 | 51 |

## 1. ශ්‍රී ලංකාවේ ඉක්මනින් නරක් වන ද්‍රව්‍ය සැපයුම් දාමයේ පසු අස්වනු හානි අඩු කිරීම සඳහා ආරක්ෂාකාරී ඇසුරුම් සහ ප්‍රවාහන ක්‍රමවේද හඳුන්වාදීම

ශ්‍රී ලංකාවේ කෘෂි වගා සැපයුම් දාමයේ සෑම අදියරකදීම බරපතල ප්‍රමාණාත්මක පසු අස්වනු හානි හා ගුණාත්මක පිරිහීම සිදුවේ. පලතුරු සහ එළවළු පසු අස්වනු හානිය 30-35% අතර පරාසයක පවතින අතර, නුසුදුසු ඇසුරුම් භාවිතය හේතුවෙන් ප්‍රවාහනයේදී මේ සඳහා වැඩිම දායකත්වයක් ලබා දෙන බව සිදු කරන ලද සමීක්ෂණ සහ අධ්‍යයනවල ප්‍රතිඵලවලින් හෙළි වී ඇත. එබැවින්, ගොවීන්, එකතුකරන්නන්, ප්‍රවාහනය කරන්නන්, තොග විකුණුම්කරුවන්, සිල්ලර වෙළෙන්දන් අතර පලතුරු සහ එළවළු ප්‍රවාහනය සඳහා සුදුසු ඇසුරුම් භාවිතය ප්‍රචලිත කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. වැඩිදියුණු කළ පසු අස්වනු තාක්ෂණයන් සහ ශ්‍රී ලංකාවේ පලතුරු සහ එළවළු සැපයුම් දාම සඳහා ඒවායේ යෙදවුම් පිළිබඳව ගොවීන්, එකතු කරන්නන්, තොග වෙළෙන්දන් සහ සිල්ලර වෙළෙන්දන්ගේ දැනුම වැඩිදියුණු කිරීම සඳහා දැනුම්වත් කිරීම් සිදු කිරීම ව්‍යාපෘතියේ එක් ප්‍රධාන ක්‍රියාකාරකමක් විය. 70% සහනාධාර පදනම මත දිවයිනේ පලතුරු සහ එළවළු සැපයුම් දාමයේ සියලුම පාර්ශ්වකරුවන් වෙත ප්ලාස්ටික් කූඩ ලබාදීම ව්‍යාපෘතියේ අරමුණයි. 2021 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ ප්‍රධාන කල් තබා ගත නොහැකි ද්‍රව්‍ය සැපයුම් දාමවල කොටස්කරුවන්ට කාණ්ඩ දෙකක් යටතේ ප්ලාස්ටික් කූඩ 31240ක් හඳුන්වා දෙන ලදී. මෙම ප්ලාස්ටික් කූඩ භාවිතයෙන් දිනකට පළතුරු සහ එළවළු මෙට්‍රික් ටොන් 500ක් පමණ ප්‍රවාහනය කෙරේ. ඒ අනුව, සමහර පලතුරු සහ එළවළුවල පසු අස්වනු හානි 30-40% සිට 15-20% දක්වා කැපී පෙනෙන ලෙස අඩු වී ඇත. 2021 වර්ෂය සඳහා මුළු අයවැය ප්‍රතිපාදනය රු.මි. 49.587 ක් වූ අතර මුළු වියදම රු.මි. 49.274 කි. භෞතික දියුණුව 100%කි.



හැසිරවීම සහ ප්‍රවාහනය සඳහා ප්ලාස්ටික් කූඩ භාවිතා කිරීම

## 2. එළවළු සහ පලතුරු සඳහා තාක්ෂණික වශයෙන් දියුණු ප්‍රාදේශීය බෙදාහැරීමේ ජාලයක් සංවර්ධනය කිරීම

එළවළු සහ පලතුරුවල අවිධිමත් බෙදාහැරීමේ දාමය ඉහළ මිල උච්ඡාවචනයකට සහ ඉක්මනින් නරක් වන ද්‍රව්‍යවල පසු අස්වනු හානි ඉහළ යාමට ප්‍රධාන හේතුවයි. එබැවින්, පලතුරු සහ එළවළු සඳහා තාක්ෂණික වශයෙන් දියුණු ප්‍රාදේශීය බෙදාහැරීමේ ජාලයක් සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘතිය දියත් කරන ලදී. ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්ට පලතුරු සහ එළවළු හැසිරවීමේ ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණයන් සහ අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා ද එය ක්‍රියාත්මක කෙරේ. ව්‍යාපෘතියට සම්බන්ධ වීමට ඔවුන් දක්වන කැමැත්ත මත සහ තෝරාගත් ප්‍රදේශවල වත්මන් සැපයුම් දාමයේ සිටින පාර්ශ්වකරුවන් අතරින් මෙම ප්‍රතිලාභීන් තෝරාගනු ලැබිණි. පළතුරු සහ එළවළු සැපයුම් දාමයේ සියලුම ක්‍රියාකාරකම් සහ පාර්ශ්වකරුවන් ආවරණය වන පරිදි ව්‍යාපෘතියේ සියලු සාධක සලකා බැලීමත් සමඟ හානි අඩු කිරීම සහ ව්‍යවසායකයින් ලබන ලාභය ඉහළ නැංවීම සහ උසස් තත්ත්වයේ නිෂ්පාදන වෙළඳපොලේ තිබීම මඟින් ව්‍යාපෘතිය ඉතා සාර්ථක කර ගැනීමට හැකි වේ. මෙය 2021 වර්ෂයේ සිට ආරම්භ වන වසර 3 ක ව්‍යාපෘතියකි. 2021 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය රු.මි.5.45 ක් වූ අතර මුළු වියදම රු.මි. 5.303කි. මූලික පියවර ලෙස, අපේක්ෂිත පරිදි ව්‍යාපෘතියට පෙර ප්‍රදේශ සහ ප්‍රතිලාභීන් එනම් ගොවීන්, ප්‍රවාහනය කරන්නන් සහ සිල්ලර වෙළෙන්දන් කවුරුන්දැයි හඳුනාගන්නා ලදී. භෞතික ප්‍රගතිය 58%කි.

## 3. ගෘහස්ථ මට්ටමේ සහල් සැකසුම් කර්මාන්ත සංවර්ධනය කිරීම

දැනට පවතින සහල් සැපයුම් දාමයේදී ගොවියා තම වී සකස් නොකළ ආකාරයෙන් අතරමැදියෙකුට අලෙවි කරන අතර මෙම වී සාමාන්‍යයෙන් වෙනම සහල් මෝලකින් සහල් බවට පත් කර වෙළෙඳ පොළේ අලෙවි කිරීම සිදු කරනු ලැබේ. එබැවින් බොහෝ අතරමැදියන් ගොවීන් සහ පාරිභෝගිකයින් අතරට සම්බන්ධ වී ඇති අතර එය සහල් සිල්ලර මිල ඉහළ යාමටත් ගොවිපොළ මිල අඩු වීමටත් හේතු වී ඇත. පාරිභෝගිකයින් වැඩිපුර මිලක් ගෙවන අතරතුර ගොවීන්ගේ ආදායම අඩුවීමට මෙය හේතු වී ඇත. ගෘහ මට්ටමින් සහල් කර්මාන්තය දියුණු කිරීමෙන් ගොවිපොළ මට්ටමින් සහල් සැකසීමේ ක්ෂුද්‍ර ව්‍යවසායන් ආරම්භ වන අතර එමඟින් ගොවීන්හට තම නිෂ්පාදනවල වෙළඳපල වටිනාකම ඉහළ නැංවීමට සහ එමඟින් ඔවුන්ගේ ආදායම සැලකිය යුතු ලෙස වැඩි කිරීමට සහ ග්‍රාමීය ගොවි අංශය අතර ස්වයං රැකියා ඇති කිරීමට මඟ පාදනු ඇත. පාරිභෝගිකයින්ට සාධාරණ මිලට උසස් තත්ත්වයේ සහල් ලැබෙනු ඇත.

ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය (NIPHM) විසින් සකස් කරන ලද ගෘහ මට්ටමේ වී තැම්බීමේ සහ සැකසුම් ක්‍රම මඟින් සුදු ලප සහ අඩු ඇඹරුම් ගුණාත්මකභාවයෙන් යුත් නිෂ්පාදනයක් බිහි කරන අසම්පූර්ණ වී තැම්බීම වැනි සාම්ප්‍රදායික වී තැම්බීමේ දුර්වලතා මඟහරවා ගෙන ඇත. අනෙක් වාසිය නම්, සහල් සැකසීමේ ක්‍රියාවලියේදී සුදුසු පසු අස්වනු තාක්ෂණයන් පිළිබඳ දැනුම, කුසලතා සහ ආකල්ප වැඩිදියුණු කිරීම තුළින් ගොවි කාන්තාවන්ට මෙම සම්පූර්ණ ක්‍රියාවලිය පහසුවෙන් සිදු කළ හැකි වීමයි. එබැවින් ඔවුන්ට තැම්බූ වී ග්‍රාමීය මට්ටමේ පාරම්පරික සහල් මෝල්කරුවන් මඟින් සහල් බවට සකස් කළ හැකි අතර ඒවා විවෘත වෙළඳපොලේ විකිණීමට හැකි වනු ඇත. නිෂ්පාදන පිරිවැය අඩු වීම (අඩු කාලයක් වැය වීම, අඩු ඉන්ධන පරිභෝජනය, අඩු ශ්‍රම පිරිවැය) සහ මෙම ක්‍රියාවලියට අඩු අතරමැදියන් සම්බන්ධ වීම ගොවියාට ඉහළ ලාභාන්තිකයක් ලබා දීමට හේතු වනු ඇත. ඒ අතරම, පාරිභෝගිකයන්ට උසස් තත්ත්වයේ සහල් සාධාරණ මිලකට අලෙවි කිරීමට ඔවුන්ට හැකි වේ.

මෙම ව්‍යාපෘතිය මඟින් ග්‍රාමීය ප්‍රජාව සඳහා වැඩිදියුණු කරන ලද වී තැම්බීමේ ශිල්පීය ක්‍රම හඳුන්වාදීමටත් වැඩිදියුණු කරන ලද වී තැම්බීමේ ශිල්පීය ක්‍රම පිළිබඳව දැනුම්වත් කිරීම සහ පුහුණු වැඩසටහන් පැවැත්වීමෙන් ග්‍රාමීය මට්ටමේ ක්ෂුද්‍ර ව්‍යවසායන් ආරම්භ කිරීමටත් යෝජනා කර ඇති

අතර, ප්‍රතිලාභින් තෝරා ගැනීමෙන් පසු ඔවුන්ට වී තැම්බීමේ උපකරණ සහ වියළන තහඩු (සූර්ය තාපයෙන් වියළීමේ ක්‍රියාවලිය සඳහා) නොමිලේ ලබා දෙන ලදී. තවද, එක් ප්‍රතිලාභියෙකුට පෙඟවීමේ ටැංකි දෙකක් 50%ක පිරිවැය ප්‍රතිපූරණ පදනම යටතේ ඉදිකර දෙන ලදී. දිවයිනේ ප්‍රධාන වී වගා කරන ප්‍රදේශවල සහල් සැකසුම් ඒකක 100ක් ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබූ අතර 2021 වර්ෂය අවසානයේදී පහත සඳහන් පරිදි ඒකක හැත්තෑ හතක් (77) ස්ථාපිත කරන ලදී; මහනුවර දිස්ත්‍රික්කයේ ඒකක 04ක්, කෑගල්ලේ ඒකක 03ක්, මාතලේ ඒකක 03ක්, කුරුණෑගල ඒකක 25ක්, යාපනයේ ඒකක 03ක්, කිලිනොච්චියේ ඒකක 05ක්, වවුනියාවේ ඒකක 01ක්, මුලතිව් හි ඒකක 01ක් සහ අම්පාර දිස්ත්‍රික්කයේ ඒකක 32ක්. 2021 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය රු. මි. 4.274 ක් වූ අතර මුළු වියදම රු.මි. 4.205කි. භෞතික ප්‍රගතිය 100%කි.



වයාපෘතියේ විවිධ අදියර

4. **ශ්‍රී ලංකාවේ ප්‍රධාන මාෂ භෝග වගා කරන ප්‍රදේශවල මාෂ භෝගවල පොතු ඉවත් කරන ඒකක ස්ථාපිත කිරීම**

මුං ඇට, උඳු, කව්පි සහ කොල්ලු ශ්‍රී ලංකාවේ ප්‍රධාන ධාන්‍ය වේ. එමෙන්ම ඉල්ලුමට සරිලන සැපයුමක් ලබා දීම සඳහා රටේ නිෂ්පාදනය තවදුරටත් ඉහළ නැංවීමට රජය පියවර ගෙන ඇත. ශ්‍රී ලංකාවේ වියළි හා අතරමැදි වර්ෂාපතන කලාපවල යැපුම් ගොවිතැන් ක්‍රම යටතේ මුං ඇට, උඳු, කව්පි වැනි ධාන්‍ය වර්ග වගා කෙරේ. කොල්ලු නුවරඑළිය දිස්ත්‍රික්කයේ විශේෂයෙන් වලපනේ ප්‍රදේශයේ වගා කෙරේ.

ධාන්‍ය වර්ග ඒවායේ බීජ සඳහා වගා කෙරේ. බීජ මිනිස් සහ සත්ව පරිභෝජනය සඳහා හෝ කර්මාන්තවල භාවිතය සඳහා තෙල් නිෂ්පාදනය සඳහා යොදා ගනී. ශාක ප්‍රෝටීනවල අඩු මිල ප්‍රභවයක් වන පරිප්පු ලෙස මාෂ භෝග පරිභෝජනය කරනු ලැබේ. මාෂ භෝගවල අන්තර්ගත ඉහළ යකඩ (Fe) සහ සින්ක් (Zn) ප්‍රතිශතය රක්තහීනතා අවදානම ඇති කාන්තාවන්ට සහ දරුවන්ට විශේෂයෙන් ප්‍රයෝජනවත් වේ. මාෂ භෝග අඩු මේදය ප්‍රමාණයකින්ද වැඩි ද්‍රාව්‍ය තන්තු ප්‍රමාණයකින්ද යුක්ත වන අතර එය කොලෙස්ටරෝල් අඩු කිරීමට සහ රුධිරයේ සීනි පාලනය කිරීමට උපකාරි වේ. ප්‍රති-පෝෂක සංයෝගය අඩු කිරීමට හෝ ඉවත් කිරීමට මාෂ භෝග සැකසීම ඉතා වැදගත් වේ. ධාන්‍ය බීජවල පොතු කිරීම සම්ප්‍රදායිකව වංගෙඩිය සහ මෝල් ගස භාවිතයෙන් සිදු හැකි අතර එය වෙහෙසකාරී හා කාලය ගත වන ක්‍රියාවලියකි. රනිල කුලයට අයත් භෝගවල පොතු ඉවත් කිරීම තන්තු සහ ටැනින් අන්තර්ගතය අඩු වීමට හේතු වන අතර, වඩාත් වැදගත් ලෙස ධාන්‍යවල පෙනුම, වයනය, පිසීමේ ගුණාත්මකභාවය, ජීර්ණය සහ රසය කෙරෙහි බලපායි.

විශේෂයෙන් මුං ඇට, උඳු, තෝර පරිප්පු, කව්පි, කොල්ලු ආදිය සඳහා මෙමඟින් ඉහළ වෙළෙඳපොළ විභවයක් නිර්මාණය වී ඇත.

NIPHM විසින් පොතු ඉවත් කිරීමේ යන්ත්‍රයක් නිපදවා ඇති අතර එය දිනකට කිලෝග්‍රෑම් 200ක ධාරිතාවයකින් යුක්ත වේ. එබැවින්, පෙර කී පරිදි සැකසූ නිෂ්පාදන සඳහා වැඩි ඉල්ලුමක් දක්නට ලැබෙන බැවින් කුඩා/මධ්‍ය පරිමාණයේ පොතු ඉවත් කිරීමේ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා මෙම යන්ත්‍රය හඳුන්වා දිය හැකිය. එබැවින්, රට තුළ කුඩා/මධ්‍යම පරිමාණයේ නව මාෂ භෝග පොතු ඉවත් කිරීමේ ඒකක 50ක් ස්ථාපිත කිරීම හරහා වෙළඳපොළේ පොතු ඉවත් කරන ලද මාෂ භෝග ලබා ගැනීමට ඇති හැකියාව ඉහළ නැංවීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය. දිවයිනේ ප්‍රධාන මාෂ භෝග වගා කරන ප්‍රදේශවල පොතු ඉවත් කිරීමේ ඒකක 15ක් ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබූ අතර 2021 වර්ෂය අවසානයේදී සියලුම ප්‍රතිලාභින් හඳුනාගෙන NIPHM හි වැඩපොළහි යන්ත්‍ර පිරිසැකසුම් කරමින් පැවතිණි. පිරිසැකසුම් කිරීමෙන් පසු කුරුණෑගල ඒකක 02ක්, කිලිනොච්චි ඒකක 01ක්, මුලතිව් ඒකක 02ක්, වවුනියාවේ ඒකක 02ක්, අනුරාධපුර ඒකක 04ක්, හම්බන්තොට ඒකක 01ක් සහ අම්පාර දිස්ත්‍රික්කයේ ඒකක 03ක් ලෙස මාෂ භෝග සැකසීමේ ඒකක ස්ථාපිත කිරීම සඳහා මෙම යන්ත්‍ර බෙදා හැරීමට නියමිතය. 2021 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය රු.මි. 2.625 ක් වූ අතර මුළු වියදම රු.මි. 2.032කි. භෞතික ප්‍රගතිය 65.7%කි.



NIPHM විසින් සංවර්ධනය කරන ලද මාෂ භෝග පොතු ඉවත් කිරීමේ යන්ත්‍රය, මාෂ භෝග පොතු ඉවත් කිරීමට පෙර සහ පසු

## 5. ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීම සඳහා සහල්, බඩ ඉරිඟු සහ ධාන්‍ය වර්ග ගොවිපළ තුළ ගබඩා කිරීමේ පහසුකම් සංවර්ධනය කිරීම

වී, බඩඉරිඟු සහ ධාන්‍ය කර්මාන්තය ගැන සලකා බැලීමේදී, නිෂ්පාදන වියදම අධික වීම සහ අස්වැන්න නෙළන කාලය තුළ ගොවිපළ මිල අඩුවීම හේතුවෙන් ගොවියා අඩු ආදායමකට සීමා වේ. එබැවින්, ගොවිපළ තුළ ගබඩා කිරීම ප්‍රවර්ධනය කිරීම සෘජු විකුණුම් අවම කරන විසඳුමක් ලෙස හඳුනාගෙන ඇති අතර එමඟින් අවාරයේ විකිණීම හරහා ගොවියාගේ ලාභාන්තිකය වැඩි කරයි. මේ අනුව, ගොවිපළේ ගබඩා පහසුකම්වල තත්ත්වය වැඩිදියුණු කිරීම සහ ධාන්‍යවල ප්‍රමාණාත්මක හා ගුණාත්මක පසු අස්වනු හානිය අවම කිරීම සහ කර්මාන්තය ආරක්ෂා කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය

ක්‍රියාත්මක කරන ලදී. වර්ෂ තුනක ක්‍රියාකාරකමක් ලෙස ව්‍යාපෘතිය යෝජනා කරන ලද අතර පළමු වසර සාර්ථකව නිම කරන ලදී. ව්‍යාපෘතිය දිස්ත්‍රික්ක හයක් තුළ ක්‍රියාත්මක කරන ලදී; එනම් අම්පාර, මුලතිව්, කුරුණෑගල, මහනුවර, අනුරාධපුර සහ හම්බන්තොට. දැනට ගෘහස්ථ පරිමාණයෙන් ධාන්‍ය ගබඩා කරන ගොවීන් ප්‍රතිලාභීන් ලෙස තෝරා ගන්නා ලද අතර එහිදී ධාන්‍ය ගබඩා කිරීමේ විද්‍යාත්මක ක්‍රමය පිළිබඳ ඔවුන්ගේ දැනුම වැඩිදියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදී. ඔවුන් අතරින් තම ගබඩාවේ පවතින තත්ත්වය වැඩිදියුණු කර ගැනීමට කැමත්තක් දක්වන ගොවීන් තෝරාගෙන ධාන්‍ය ගබඩාව විද්‍යාත්මකව ප්‍රතිසංස්කරණය කිරීමට මගපෙන්වීම සිදු කරන ලද අතර පෙර සකස් කරන ලද ප්‍රමිති ඇස්තමේන්තුවක් මත දීමනාවක් ලබා දෙන ලදී. 2021 වර්ෂය තුළ පුහුණු වැඩසටහන් හතක් පවත්වන ලද අතර පැවති වසංගත තත්ත්වය හේතුවෙන් ඇතැම් ගොවීන් තනි තනිව ද පුහුණු කරන ලදී. තවද, ගොවිපළ ගබඩා 68ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා දීමනා ලබා දෙන ලදී (මහනුවර- ඒකක 05, කුරුණෑගල- ඒකක 13, කිලිනොච්චි- ඒකක 01, වවුනියාව- ඒකක 02, මුලතිව්- ඒකක 12, අම්පාර - ඒකක 31, අනුරාධපුර - ඒකක 02 සහ හම්බන්තොට - ඒකක 02) 2021 වසර සඳහා අයවැය ප්‍රතිපාදන රු.මි. 1.78ක් වූ අතර රු.මි. 1.747 ක් වැය කරන ලදී. භෞතික ප්‍රගතිය 100%කි.



පුහුණු වැඩසටහන් පැවැත්වීම, ගොවිපළ ගබඩා වැඩිදියුණු කිරීමට පෙර සහ වැඩිදියුණු කළ ගබඩා පහසුකම්

## 6. ශ්‍රී ලංකාවේ පලතුරු අගය දාමයේ පාර්ශ්වකරුවන් සවිබල ගැන්වීම සඳහා ද්විතීයික සැකසුම් මධ්‍යස්ථාන පිහිටුවීම

වර්තමානයේදී, ඉක්මනින් නරක් වන ද්‍රව්‍යවල පසු අස්වනු හානිය අවම කර ගන්නේ කෙසේද යන්න ජාතික මට්ටමේ එක් ප්‍රධාන අභියෝගයක් වී ඇත. නිසි අගය එකතු කිරීම පිළිබඳ දැනුම හා තාක්ෂණය නොමැතිකම ජාත්‍යන්තර වෙළඳපොළ ඉල්ලුමට සරිලන පරිදි මෙරට පලතුරු සැකසුම් ක්ෂේත්‍රය දියුණු කිරීමටත් එමගින් ලොව පුරා පලතුරු ආශ්‍රිත නිෂ්පාදන ලබා ගැනීමට ඇති හැකියාව වැඩි කිරීමටත් ඇති ප්‍රධාන බාධාවක් වේ. ආහාර කල් තබා ගැනීමේ ක්‍රම (සැකසුම් කරන ලද සහ අගය එකතු කළ නිෂ්පාදන) භාවිතය පලතුරුවල පසු අස්වනු හානි අවම කර ගැනීමට ඇති එක් විකල්පයකි. පලතුරු සංරක්ෂණය කිරීමේ වඩාත් සුලභ හා ජනප්‍රිය ක්‍රම වන්නේ පල්ප් කිරීම සහ විජලනය වන අතර එමගින් කල් තබා ගත හැකි කාලය වැඩි වේ.

මෙම ව්‍යාපෘතිය හරහා, පල්ප කිරීමේ මධ්‍යස්ථාන තුනක් සහ විජලනය කිරීමේ (පලතුරු සැකසුම්) මධ්‍යස්ථාන දෙකක් ස්ථාපිත කිරීමෙන් ඉලක්ක ප්‍රතිලාභීන් සඳහා මූලික සහයෝගය ලබා දීම සඳහා අවාරයේදී පලතුරු අගය එකතු කිරීමේ පිළිවෙත් සඳහා භාවිතා කළ හැකි විජලන සහ පල්ප් නිෂ්පාදන මාර්ග අනුරාධපුර, මාතර, කුරුණෑගල, මොනරාගල සහ කෑගල්ල දිස්ත්‍රික්කවල ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. තෝරාගත් තාක්ෂණයන් දෙකක් පිළිබඳව පුහුණු වැඩසටහන් හරහා ප්‍රතිලාභීන් පුහුණු කරන ලදී. ඔවුන් දැනටමත් තෝරාගත් ක්‍රියාකාරකම් සඳහා සහභාගී වී සිටිනවාද හෝ කැමැත්තෙන් සිටිනවාද යන්න තෝරා ගැනීමේ ප්‍රධාන නිර්ණායක වූ අතර ප්‍රතිලාභීන් තෝරාගැනීමේදී ප්‍රතිලාභී සමිති විසින් කරන ලද ඉල්ලීම් සලකා බලන ලදී.

මෙම ව්‍යාපෘතිය මඟින් NIPHM හි හිමිකාරිත්වය යටතේ ප්‍රතිලාභීන් වෙත අදාළ යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ලබාදීමට සහ ඔවුන් සමඟ ගිවිසුමක් අත්සන් කරමින් සපයා ඇති පහසුකම් නිසි ලෙස භාවිත කිරීම සහතික කිරීමට යෝජනා කරන ලදී. වසර දෙකක අධීක්ෂණයෙන් පසු සහ ප්‍රතිලාභීන් විසින් ව්‍යාපෘති ක්‍රියාකාරකම් නිසි ලෙස ක්‍රියාත්මක කිරීම මත පදනම්ව යන්ත්‍රෝපකරණ සහ උපකරණවල අයිතිය ප්‍රතිලාභියා වෙත පැවරෙනු ඇත. අගය එකතු කිරීම සම්බන්ධ ව්‍යාපාරවල නිරත වීමට කැමති ප්‍රතිලාභීන් සඳහා පල්ප කිරීමේ සහ විජලනය කිරීමේ මධ්‍යස්ථාන ඇති කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රතිදානය වන අතර පල්ප කිරීම සහ විජලනය වැනි අගය එකතු කිරීමේ ක්‍රම හඳුන්වාදීමෙන් පසු අස්වනු හානිය අවම කිරීම එහි ප්‍රතිඵලය වේ. නමුත් රට තුළ පවතින මූල්‍ය අර්බුදය හේතුවෙන් වසර අවසානයේදී පවා පල්ප කිරීමේ යන්ත්‍ර සැපයුම්කරුවන් විසින් ලබා දී නොමැත. එබැවින් විජලනය කිරීමේ ඒකක පිහිටුවීම සිදුවෙමින් පවතින නමුත් පල්ප කිරීමේ ඒකක ස්ථාපිත කර නැත. මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ප්‍රතිපාදනය රු.මි. 3.995 ක් වන අතර මුළු වියදම රු.මි. 3.45කි. භෞතික ප්‍රගතිය 88.3%කි.



අගය එකතු කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම

## 7. ග්‍රාමීය මට්ටමින් කුළුබඩු සැකසීමේ ක්ෂුද්‍ර ව්‍යවසායන් හඳුන්වාදීම

සකස් කරන ලද ආහාරවල රුචිය සහ රසය වැඩි කිරීම සඳහා කුළුබඩු වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. අඹරන ලද කුළුබඩු ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි සියලුම ව්‍යංජන සඳහා බහුලව භාවිතා වේ. කුළුබඩු ප්‍රධාන වශයෙන් වෙළඳාම් කරනු ලබන්නේ සකස් නොකළ ආකාරයෙන් වුවද, කුඩා නමුත් සැලකිය යුතු ප්‍රමාණයක් කුඩු කරන ලද කුළුබඩු ලෙස ජාත්‍යන්තර වෙළඳපොළට ඇතුල් වේ. තුනපහ එම සංයෝග හෝ මිශ්‍රණ අතර ප්‍රමුඛතම එකක් වන අතර සමහර අවස්ථාවල ලොව පුරා අගය කරනු ලබන ශ්‍රී ලාංකික ව්‍යංජනයක ලාක්ෂණික රසය එක් කිරීමට නිර්මාණය කර ඇති කුළුබඩු 20ක් හෝ වැඩි ගණනකින් සමන්විත වේ. එබැවින් ආකර්ශනීය ඇසුරුම්වල අමිශ්‍ර කුළුබඩු සහ තුනපහ සඳහා ඉල්ලුම සීඝ්‍රයෙන් වැඩිවෙමින් තිබේ. එපමණක් නොව, කුළුබඩු ආනයනය සීමා කිරීම පිළිබඳව පනවා ඇති වත්මන් රෙගුලාසි හේතුවෙන් රට තුළ කුළුබඩු වගාව වැඩි වීමට හේතු වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, කුළුබඩු සැකසීම සඳහා වෙළඳපොළ තුළ දැවැන්ත විභවයක් ඇත.

මෙම සන්දර්භය තුළ, රට තුළ කුළුබඩු සැකසීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර, එමඟින් කුඩා/මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්, ගොවීන් සහ රැකියා විරහිත තරුණ තරුණියන් අගය එකතු කිරීම තුළින් තම ආදායම් මට්ටම ඉහළ නැංවීම සඳහා කෘෂි සැකසුම් කර්මාන්ත ස්ථාපිත කිරීම පිළිබඳව දැනුම්වත් කෙරේ. 2021 වර්ෂයේදී දිවයින පුරා කුළුබඩු සැකසුම් ඒකක 15ක් (මහනුවර- ඒකක 02, කුරුණෑගල- ඒකක 02, මුලතිව්- ඒකක 01, අම්පාර- ඒකක 03, අනුරාධපුර- ඒකක 04, කෑගල්ල- ඒකක 01, හම්බන්තොට- ඒකක 01, කිලිනොච්චිය- ඒකක 01) ස්ථාපිත කිරීමට NIPHM ට හැකි විය.

50% සහනාධාර පදනමින් යන්ත්‍රෝපකරණ ලබාදීමට පෙර ව්‍යාපෘති ප්‍රතිලාභීන්ට කුළුබඩු සැකසීම පිළිබඳව මනා පුහුණුවක් ලබා දෙන ලදී. ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 1.13 ක් වූ අතර වියදම රු.මි. 1.053ක් විය. භෞතික ප්‍රගතිය 100%කි.





සියඹලා සකස් කිරීම පිළිබඳව පුහුණු කිරීම

## 8. දේශීය අල වර්ග, කොස්, බඩ ඉරිඟු, වට්ටක්කා සහ අනෙකුත් ආහාර භෝග යොදා ගනිමින් අගය එකතු කළ නිස්සාරණ නිෂ්පාදන සංවර්ධනය සඳහා මධ්‍ය පරිමාණ නිස්සාරණ ඒකක පිහිටුවීම.

වර්තමානයේදී නිස්සාරිත (extruded) නිෂ්පාදන තරුණ පරපුර අතර ඉතා ජනප්‍රිය වී ඇත. එබැවින් ආහාර ගැනීමට සූදානම් වඩාත් පෝෂ්‍යදායී ආහාර ද්‍රව්‍ය හඳුන්වා දීමේ අවශ්‍යතාවයක් පවතී. මේ අනුව, පවතින බව, ජනප්‍රියත්වය සහ පෝෂණය සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකාවේ හොඳින් වැවෙන අල, කොස්, බඩඉරිඟු, වට්ටක්කා සහ අනෙකුත් ආහාර භෝග යොදා ගනිමින් නිස්සාරණ (extrusion) ක්‍රියාවලිය හරහා අගය එකතු කළ නිෂ්පාදන සංවර්ධනය කළ හැකිය. වාරය අනුව හටගන්නා භෝග සහ ඉහළ මිල උච්චාවචනයන් සහිත භෝග සඳහා අගය එකතු කළ නිෂ්පාදන ලෙස සකස් කරන ලද නිෂ්පාදන භාවිතා කළ හැකිය. වාරයේ ඇති අතිරික්ත නිෂ්පාදනය ප්‍රයෝජනයට ගැනීමෙන් පසු අස්වනු හානිය අවම කර ගත හැකි අතර වෙළඳපොළේ ආහාර නිෂ්පාදනවල විවිධාංගීකරණය ද වැඩි කළ හැකිය.

ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනයේ නිස්සාරණ සැකසුම් මධ්‍යස්ථානය ස්ථාපිත කෙරේ. අතිරික්ත නිෂ්පාදනයක් සහිත තෝරාගත් භෝග ප්‍රධාන වශයෙන් වගා කරන ප්‍රදේශ තෝරාගෙන ආහාර සැකසුම් කර්මාන්තයේ නියැලීමට කැමති ව්‍යවසායකයන් සහ දැනටමත් නිස්සාරණ ආහාර කර්මාන්තයේ නියැලී සිටින ව්‍යවසායකයන් සඳහා පුහුණු හා තාක්ෂණ හුවමාරු වැඩසටහන් පවත්වනු ලැබේ. මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා නව්‍ය නිස්සාරණ ශිල්පීය ක්‍රම හඳුන්වාදීමට ව්‍යාපෘතිය මඟින් යෝජනා කරනු ලැබේ. අල, කොස්, බඩ ඉරිඟු, වට්ටක්කා සහ අනෙකුත් දේශීය ආහාර ද්‍රව්‍ය වගා කරන ගොවීන් 100 දෙනෙකු නිස්සාරණය කරන ලද කෙටි ආහාර නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය සැපයීම සඳහා තෝරා ගනු ලැබේ.

නිස්සාරණ ඒකකය ප්‍රධාන වශයෙන් පිටි මිශ්‍රකය, ද්විත්ව ඉස්කුරුප්පු නිස්සාරණ යන්ත්‍රය සහ රසය එක් කරන යන්ත්‍රයකින් සමන්විත වේ. ස්වයංක්‍රීය ගෑස් පිරවුම් බෑන්ඩ් සීලරය, කණ්ඩායම්/දින සංකේත යන්ත්‍රය, විදුලි බර කිරන යන්ත්‍රය සහ අනෙකුත් උපකරණ වෙනත් ආධාරක අයිතම ලෙස ඇණවුම් කරන ලදී. සියලුම යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ඇණවුම් කරන ලද නමුත් කොවිඩ්-19 තත්ත්වය සහ රටේ පවතින ආර්ථික තත්ත්වය හේතුවෙන් ප්‍රමාද විය.
ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත මුදල රු.මි. 4.01 ක් වූ අතර වියදම රු. මි.3.9196ක් විය. භෞතික ප්‍රගතිය 76.2%කි.

## 9. නව නිෂ්පාදන සංවර්ධන (NPD) ක්‍රියාපටිපාටි ශක්තිමත් කිරීම සඳහා සහ නිෂ්පාදන තත්ත්ව වැඩිදියුණු කිරීම සඳහා රසායනාගාර පහසුකම් වැඩිදියුණු කිරීම

NIPHM ප්‍රධාන වශයෙන් පර්යේෂණ සහ සංවර්ධන කටයුතු, විශ්වවිද්‍යාල සිසුන්, වෙනත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන වැනි බාහිර පාර්ශ්ව සඳහා තාක්ෂණ පැවරීම සහ පරීක්ෂණාගාර සේවා සැපයීම යන ක්‍රියාකාරකම්වල යෙදී සිටී. ජාතික වගකීම් සඳහා උරදෙන ආයතනයක් ලෙස. පසු අස්වනු හානි සඳහා ශක්‍ය විසඳුමක් සෙවීම සඳහා ජාතික ප්‍රමුඛතාවයක් ලෙස හඳුනාගත හැකි බැවින් කෘෂිකාර්මික භාණ්ඩ සඳහා අගය එකතු කිරීමේ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් තුළින් අගනා ලෙස ස්ථාපිත සංකල්ප සහ ක්‍රමවේදයන් සමඟින් ව්‍යවසායකයන් සවිබල ගැන්වීමේ දී NIPHM ඉතා ශක්තිමත් භාවයක් පෙන්නුම් කරයි. පරීක්ෂණාගාර පහසුකම්වල හිඩැස් පරීක්ෂණාගාර කටයුතුවල ගුණාත්මකභාවයට මෙන්ම බාහිර පාර්ශ්වයන්ට ලබා දෙන සහාය සහ සහයෝගයට සෘජුවම බලපායි. ඊට අමතරව, ශ්‍රී ලංකාව තුළ ආහාර නිෂ්පාදන තත්ත්ව පරීක්ෂණ පහසුකම් සීමිතව පවතින අතර එම ස්ථානවල අය කරනු ලබන මිල ගණන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට දැරිය නොහැක. එබැවින් කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන තත්ත්ව පරීක්‍ෂණවලදී ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා දැරිය හැකි මිලකට එම පරීක්ෂණ සඳහා පහසුකම් සැලසිය හැකි රජයේ ආයතනයක් බවට පත්වීම සඳහා NIPHM හි පරීක්ෂණාගාර වැඩිදියුණු කිරීමට මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ඇත. මෙය වසර දෙකක ව්‍යාපෘතියක් වන අතර පළමු වසර තුළ අපගේ පරීක්ෂණාගාරවල ධාරිතාවය ශක්තිමත් කිරීම සඳහා ස්ටොමැචර් බ්ලෙන්ඩරයක් සහ නිර්වායු ඉන්කියුබේටරයක් මිලදී ගැනීමට අපට හැකි වූ අතර ඉදිරි වසර තුළ තවත් උපකරණ කිහිපයක් මිලදී ගැනීමට තිබේ. පරීක්ෂණාගාර සඳහා නව එකතු කිරීම් සමඟින්, ආහාර ද්‍රව්‍යවල අගය එකතු කිරීම වර්ධනය වන වෙළඳපළ අවශ්‍යතාවයට ළඟා විය හැකි බොහෝ මාර්ග වෙත පුළුල් වනු ඇත. 2021 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතියට වෙන් කරන ලද මුළු අයවැය රු.මි. 1.8 ක් වූ අතර පළමු වසර සඳහා වියදම රු.මි.1.78 කි.

## තාක්ෂණ පැවරීමේ ක්‍රියාකාරකම්

ව්‍යාප්ති අංශය රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමග සම්බන්ධීකරණය වෙමින් දිවයින පුරා ඇති එහි ව්‍යාප්ති මධ්‍යස්ථාන හරහා සිය තාක්ෂණ ව්‍යාප්ත කිරීම් කටයුතු සිදු කරයි. 2021 වර්ෂය තුළ දී ආයතනයෙහි ප්‍රධාන ක්‍රියාකාරකම්වලින් එකක් වන ක්ෂේත්‍ර මට්ටමේ ව්‍යාප්ති කටයුතු හරහා තාක්ෂණ ව්‍යාප්ත කිරීම අඛණ්ඩව සිදු කරන ලදි

**තාක්ෂණ පැවරීම් කටයුතු සඳහා තෝරාගත් විවිධ ප්‍රධාන අංශ**

a) කෘෂි භෝගවල පසු අස්වනු හානිය අවම කිරීම
b) ගබඩාකරණ ක්‍රම සඳහා තාක්ෂණය හඳුන්වාදීම
c) සහල්, මාෂ භෝග සහ අනෙකුත් ධාන්‍ය සැකසීම
d) කුළුබඩු සැකසීම
e) පලතුරු සහ එළවළු සඳහා අගය එකතු කිරීම
f) සහල් සහ මාෂ භෝග ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධනය
g) ශ්‍රී ලංකාවේ මානව පෝෂණය හා ආහාර පුරුදු පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩසටහන්

භෝග වගා කරන ප්‍රධාන ප්‍රදේශවල පිහිටි පහත සඳහන් පසු අස්වනු තාක්ෂණ මධ්‍යස්ථාන අටකින් දිවයින පුරා ව්‍යාප්ති ජාලය සමන්විත වේ:

1. අනුරාධපුරය (අනුරාධපුරය, පොලොන්නරුව, ත්‍රිකුණාමලය ආවරණය කිරීම)
2. අඹන්පොල (කුරුණෑගල, පුත්තලම ආවරණය කිරීම)
3. මහනුවර (මහනුවර, මාතලේ, කෑගල්ල ආවරණය කිරීම)
4. නුවරඑළිය (නුවරඑළිය, වැලිමඩ සහ බදුල්ල ආවරණය කිරීම)
5. අම්පාර (අම්පාර, මොණරාගල, මඩකලපුවෙහි කොටසක්, මහවැලි සී කලාපය ආවරණය කිරීම)
6. හම්බන්තොට (හම්බන්තොට, මාතර, ගාල්ල, ඇඹිලිපිටිය ආවරණය කිරීම)
7. කිලිනොච්චිය (කිලිනොච්චිය, වව්නියාව, මුලතිව්, යාපනය, මන්නාරම ආවරණය කිරීම)
8. කොළඹ (කොළඹ, ගම්පහ, කළුතර ආවරණය කිරීම)



**වර්තමානයේ දිවයින පුරා තාක්ෂණ පැවරීම් කටයුතු ව්‍යාප්ති මධ්‍යස්ථාන 8ක් මඟින් ආවරණය වේ.**

**පුහුණුව**

අවසානයේදී පසු අස්වනු හානි අවම කිරීම සඳහා කෘෂිකාර්මික භාණ්ඩවල සැපයුම් සහ වටිනාකම් දාම වැඩිදියුණු කිරීමේ අරමුණින් පුහුණු වැඩසටහන් පවත්වන ලදී. මෙම වැඩසටහන් පහත සඳහන් උපාය මාර්ග දෙකක් යටතේ පවත්වන ලදී:

- නේවාසික පුහුණු වැඩසටහන්
- නේවාසික නොවන වැඩසටහන්

ආයතනයේ පවත්වනු ලබන වැඩසටහන් නේවාසික පුහුණු වැඩසටහන් ලෙසත් ක්ෂේත්‍රයේ පවත්වනු ලබන වැඩසටහන් නේවාසික නොවන පුහුණු වැඩසටහන් ලෙසත් හඳුන්වනු ලැබේ. මෙම සියලුම වැඩසටහන් පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා මත පදනම් වන අතර ප්‍රතිලාභීන්ගේ පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහා සංවිධානය කර ඇත.

**නේවාසික පුහුණු වැඩසටහන්**

මෙම පුහුණු වැඩසටහන් අනුරාධපුර පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. පුහුණු වැඩසටහන්වල ප්‍රතිලාභීන් ප්‍රධාන වශයෙන් ගොවීන්/ගොවි කාන්තාවන්, එකතුකරන්නන්, ප්‍රවාහනය කරන්නන්, තොග විකුණුම්කරුවන්, සිල්ලර වෙළෙන්දන් සහ සැකසුම්කරුවන් විය. තවද මෙම වැඩසටහන්, රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානවල නිලධාරින්, විශ්වවිද්‍යාල, කාර්මික විද්‍යාල සහ පාසල් ශිෂ්‍යයන් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීම යටතේ පවත්වා ඇත. මෙම වැඩසටහන් මඟින් පසු අස්වනු තාක්ෂණ, ව්‍යවසාය සංවර්ධනය, හානි අඩු කිරීම, ක්‍රියාවලි සහ තත්ත්වය වැඩිදියුණු කිරීම ආදිය පිළිබඳ දැනුම්වත්භාවය ඇති කිරීම ඉලක්ක කර ඇත.

2021 වර්ෂය තුළ කෙටි කාලීන නේවාසික පුහුණු පාඨමාලා 10ක් පවත්වා, පසු අස්වනු තාක්ෂණයේ විවිධ විෂයයන් සම්බන්ධයෙන් පුද්ගලයින් 448 දෙනෙකුට පුහුණුව ලබා දී ඇති අතර ඒ පිළිබඳ විස්තර සංඛ්‍යා ලේඛනවල දක්වා ඇත. කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් පනවන ලද සෞඛ්‍ය මාර්ගෝපදේශ හේතුවෙන් නේවාසික වැඩසටහන් බොහොමයක් අවලංගු කිරීමට සිදු විය.

| කාණ්ඩය | විස්තර | වැඩසටහන් සංඛ්‍යාව | පුහුණුවන්නන් සංඛ්‍යාව |
|---|---|---|---|
| A | ගොවීන්/ගෙවිලියන් සහ ගොවි සංවිධානවල සාමාජිකයින් සඳහා පසු අස්වනු තාක්ෂණය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් | 02 | 47 |
| B | කුඩා/මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා ආහාර සැකසීම සහ අගය එකතු කිරීම පිළිබඳ වැඩසටහන් | 05 | 81 |
| C | 1. ද්විතියික පාසල්, විශ්වවිද්‍යාල, කෘෂි විද්‍යාල සහ කාර්මික විද්‍යාලවල සිසුන් (කාර්මික පුහුණුව සඳහා සිසුන් ඇතුළුව) | 01 | 276 |
| | 2. (කාර්මික පුහුණුව සඳහා සිසුන් ඇතුළුව) | | 14 |
| D | පුද්ගල ඉල්ලීම් සඳහා පුහුණු වැඩසටහන් | 02 | 30 |
| **එකතුව** | | **10** | **448** |

**අනේවාසික/ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන්**

මෙම වැඩසටහන් ක්ෂේත්‍රය තුළදීම සිදු කෙරේ. මෙම පුහුණු කිරීම් අනුරාධපුර පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය සහ NIPHM හි ව්‍යාප්ති මධ්‍යස්ථාන මඟින් පවත්වන ලදී. 2021 වර්ෂය තුළදී ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් සහ ඉදිරිපත් කිරීම් 65ක් පවත්වා ඇති අතර 1004 දෙනෙකු පුහුණු කර ඇත

ගොවීන්/ගෙවිලියන්, එක්රැස් කරන්නන්, ප්‍රවාහනය කරන්නන්, තොග වෙළෙන්දන්, සිල්ලර වෙළෙන්දන් සහ සකස් කරන්නන් ඇතුළු කෘෂිකාර්මික නිෂ්පාදනවල සැපයුම් සහ අගය දාමයන්හි පාර්ශ්වකරුවන් ඉලක්ක කර ගනිමින් උදෙසා පවත්වන ලදී. මෙම වැඩසටහන් මඟින් පසු අස්වනු තාක්ෂණ, ව්‍යවසාය සංවර්ධනය, හානි අඩු කිරීම, ක්‍රියාවලි සහ තත්ත්වය වැඩිදියුණු කිරීම ආදිය පිළිබඳව දැනුම්වත්භාවය ඇති කිරීම සිදු කරන ලදී

මෙම ප්‍රතිලාභීන් බොහොමයක් මෙම පුහුණු වැඩසටහන්වලින් ලබා දෙන ලද තාක්ෂණයන් භාවිතා කරමින් සිටී. අත්පත් කර ගනු ලැබූ තාක්ෂණික දැනුම තුළින්, දැනුම වැඩිදියුණු කර ගැනීම, නිෂ්පාදනයෙහි තත්ත්වය ඉහළ නංවා ගැනීම, ආදායම් උත්පාදනය, ග්‍රාමීය සවිබලගැන්වීම සහ වෙනත් බොහොමයක් ප්‍රතිලාභ අත්පත් කරගෙන ඇත. ආහාර සුරක්ෂිතතාව සම්බන්ධ ජාතික සංවර්ධනයෙහි එක් ප්‍රධාන සීමාකාරී සාධකයක් වන කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ හානි අඩු කිරීම සහ තත්ත්වය ඉහළ නැංවීම සඳහා මෙය සෘජුවම දායකත්වය ලබා දෙනු ලැබේ.

| කාණ්ඩය | විස්තර | වැඩසටහන් සංඛ්‍යාව | පුහුණුවන්නන් සංඛ්‍යාව |
|---|---|---|---|
| A | සංවර්ධන ව්‍යාපෘති ආශ්‍රිත පුහුණු වැඩසටහන් | 51 | 831 |
| B | ක්ෂේත්‍ර ඉල්ලීම මත පදනම්ව පවත්වනු ලබන පුහුණු වැඩසටහන් | 14 | 173 |
| **එකතුව** | | **65** | **1004** |

තවද මෙම පාර්ශ්වකරුවන් පුහුණු කිරීම කර්මාන්ත සංවර්ධනයට, ආර්ථික සංවර්ධනයට සහ සමාජ සංවර්ධනයට සහ වැඩිදියුණු කළ ජීවන තත්ත්වයන් සඳහා ද දායක වී ඇත. මේ අනුව කෘෂි ආශ්‍රිත කර්මාන්ත සඳහා නව ව්‍යවසායකයින් 102ක් හඳුන්වා දුන් අතර මෙම කර්මාන්ත අතර කුළුබඩු ආශ්‍රිත නිෂ්පාදන සන්නාම 18ක්, සහල් ආශ්‍රිත නිෂ්පාදන සන්නාම 43ක්, විජලනය කළ පලතුරු නිෂ්පාදන වෙළෙඳ නාම 05ක්, පලතුරු ආශ්‍රිත නිෂ්පාදන වෙළෙඳනාම 32ක් සහ මාෂ භෝග ආශ්‍රිත නිෂ්පාදකයන් 04ක් ඇතුළත් වේ.







ක්ෂේත්‍රය තුළ තාක්ෂණය යෙදවීම

## උපදේශන සේවාවන්

ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය (NIPHM) පසු අස්වනු කර්මාන්තයට ඍජුව හෝ වක්‍රව සම්බන්ධ රාජ්‍ය, පෞද්ගලික සහ සමූපකාර අංශයේ ආයතන සඳහා උපදේශන සහ වෙනත් සේවාවන් සපයයි. මෙමඟින් නව සැකසුම් යන්ත්‍රාගාර ස්ථාපිත කිරීම, පවතින මෝල් සහ යන්ත්‍රාගාර නවීකරණය කිරීම සහ සහල් මෝල්කරුවන් සහ අනෙකුත් ආහාර සකස් කරන්නන් සිය එදිනෙදා කටයුතුවලදී මුහුණ දෙන තාක්ෂණික ගැටලු විසඳීම සඳහා සේවාවන් ලබා දේ. 2021 වර්ෂයේදී ඔවුන්ගේ ඉල්ලීම පරිදි විවිධ කෘෂි ආහාර සැකසුම් කර්මාන්ත සඳහා තාක්ෂණික වාර්තා, ශක්‍යතා වාර්තා සහ විශේෂ වාර්තා සකස් කිරීමට NIPHM උපකාර විය. විශේෂයෙන් කාර්මික නිෂ්පාදන සහ ක්‍රියාවලි මාර්ග යන දෙඅංශයේම තත්ත්ව පාලන ක්‍රියාකාරකම් සඳහා පරීක්ෂණාගාර සහ ඉංජිනේරු සේවා සැපයීමෙන් ආයතනය පාර්ශ්වකරුවන්ට සහාය විය. පරීක්ෂණාගාර සේවාවන් රසායනික, භෞතික සහ ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක සේවාවන්ගෙන් සමන්විත වූ අතර ඉංජිනේරු සේවාවන්ට යන්ත්‍රෝපකරණ සහ උපකරණ පරීක්ෂා කිරීම සහ ඇගයීම් සහ ක්‍රියාකරු පුහුණුව ඇතුළත් විය. 2021 වර්ෂයේදී දිවයින පුරා පසු අස්වනු කර්මාන්තය සඳහා උපදේශන 21ක් ලබාදීමට ආයතනයට හැකි විය.

ලබා දෙන ලද උපදේශනවල සාරාංශගත විස්තර පහත ලැයිස්තුගත කර ඇත.

| අංකය | ගනුදෙනුකරුවන්ගේ නම | සේවාවන් |
|---|---|---|
| 01 | මහින්දරත්න සහල් මෝල, තඹුත්තේගම | සහල් මෝල්වල අප ජල පවිත්‍රාගාරයක් පිහිටුවීමේ ව්‍යාපෘති වාර්තාව |
| 02 | එම්.ඒ.ආර්.එස්.ආනන්ද, කිරිඳිවැල | සහල් කෙටීම පිළිබඳ උපදේශන සේවාව |
| 03 | දර්ශන ගලප්පත්ති, රාගම | උඳු පොතු ඉවත් කිරීම - නියැදි පරීක්ෂාව |
| 04 | උපුල් කුමාර | උඳු පොතු ඉවත් කිරීම |
| 05 | ශ්‍රියාන් එදිරිසිංහ, වැලිකන්ද | සහල් ඇඹරීම පිළිබඳ උපදේශන සේවාව |
| 06 | කළමනාකරු, සමුපකාර තොග ආයතනය | TEC සඳහා සහභාගී වීම සහ හිඟුරක්ගොඩ සහල් මෝල සඳහා තාක්ෂණික ඇගයීම් වාර්තාව ලබා දීම. |
| 07 | එස්.එම්.ජේ.එම්.කුමාර | මාෂ භෝග පොතු ඉවත් කිරීමේ යන්ත්‍රය ලබා දීම |
| 08 | කළමනාකරු, සීමාසහිත බහු සේවා සමුපකාර සමිතිය, හිඟුරක්ගොඩ | සහල් මෝල් පරීක්ෂා කිරීම |
| 09 | ජේ.පී.අයි. කමල්සිරි, කන්තලේ | සහල් මෝල පරීක්ෂා කිරීම. |
| 10 | අධ්‍යක්ෂ, ආහාර ප්‍රවර්ධන මණ්ඩලය | තක්සේරු කිරීමේ තාක්ෂණික ඇගයීම් කමිටුවට සහභාගී වී කලංකුට්ටිය ආහාර සැකසුම් ඒකකයේ භාණ්ඩ කිහිපයක් විනාශ කිරීම. |
| 11 | කළමනාකරු, සීමාසහිත විවිධ සේවා සමුපකාර සමිතිය, පේමඩුව, විලච්චිය | සහල් සැකසුම් ඒකකය නවීකරණය කිරීම සහ දෙහි සැකසීම පිළිබඳ ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කිරීම |
| 12 | එන්. හර්ෂ ජයන්ත, SAFE පදනම | මිරිස් සැකසීම සඳහා පිරිවිතර සැපයීම |
| 13 | අරුණ රූපසිංහ, කෘෂිකර්ම අංශය, නවීකරණ ව්‍යාපෘතිය | සහල් මෝල් පරීක්ෂා කිරීම |
| 14 | ප්‍රියමනී හේමචන්ද්‍ර | අඹ ආශ්‍රිත නිෂ්පාදන සහ මුරුංගා කුඩු සකස් කිරීම පිළිබඳ උපදේශනය |
| 15 | තීක්ෂනා නයන්තරා, අම්පාර | පළතුරු සහ එළවළු විජලනය කිරීම පිළිබඳ තාක්ෂණික වාර්තාවක් සැපයීම |
| 16 | කළමනාකරු, සීමාසහිත විවිධ සේවා සමුපකාර සමිතිය, කොබෙයිගනේ | සහල් මෝල පරීක්ෂා කිරීම |
| 17 | කෘෂිකර්ම අමාත්‍යාංශයේ ‘යන්ත්‍ර සූත්‍ර නවෝත්පාදන’ වැඩසටහන | ජේ.කේ.ඩබ්ලිව්.එස්. ජයසුන්දර මහතාගේ යන්ත්‍රෝපකරණ පරීක්ෂා කිරීම |
| 18 | කෘෂිකර්ම අමාත්‍යාංශයේ ‘යන්ත්‍ර සූත්‍ර නවෝත්පාදන’ වැඩසටහන | මඩකලපුවේ යන්ත්‍රෝපකරණ පරීක්ෂා කිරීම |
| 19 | සිලෝන් ෆස්ට් එක්ස්පෝටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්, තඹුත්තේගම | පළතුරු සහ එළවළු බෝතල් කිරීම සඳහා තාක්ෂණික උපදෙස් |
| 20 | ආර්.ඩී.වී.ජේ. රාජපක්ෂ, හොරණ පාර, හඳපාන්ගොඩ | ආහාර විජලනය පිළිබඳ ව්‍යාපෘති වාර්තාව |
| 21 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | දිවයිනේ විවිධ ස්ථානවල මිරිස් වියළන යන්ත්‍ර 50ක් ලබාදීමට/ ස්ථාපිත කිරීම සඳහා තාක්ෂණික සහාය |

**පරීක්ෂණාගාර සේවාවන්**

පෞද්ගලික සහ රාජ්‍ය ආයතනවලින් ලැබෙන නියැදිවල භෞතික, රසායනික හා ක්ෂුද්‍ර ජීවී ගුණාංග සඳහා විශ්ලේෂණය කිරීම මඟින් රට තුළ කෘෂි/ආහාර නිෂ්පාදනවල තත්ත්ව පාලනය කිරීම සඳහා ආයතනය වැදගත් කාර්යභාරයක් ඉටු කරන ලදී. NIPHM සතුව ඉතා දියුණු පරීක්ෂණාගාර පහසුකම් ඇත; විශේෂයෙන්ම රසායන විද්‍යාගාරයෙහි පරමාණුක අවශෝෂණ වර්ණාවලීක්ෂය, වායු වර්ණාවලිමානය සහ ඉහළ කාර්ය සාධන ද්‍රව වර්ණාවලිමානය, වායු වර්ණාවලි ස්කන්ධ වර්ණාවලීක්ෂය ආදී උපකරණ ස්ථාපිත කර ඇති අතර අලුතින් ප්‍රතිසංස්කරණය කරන ලද ක්ෂුද්‍රජීව විද්‍යාගාරය ජෛව ආරක්ෂණ කුටිය, පීඩනතාපකය, ඉන්කියුබේටර, උදුන්, ආලෝක අන්වීක්ෂ සහ රූප සැකසුම් අන්වීක්ෂ ආදියෙන් සමන්විත වේ

මෙම පහසුකම් භාවිතා කරමින්, NIPHM විසින් පරීක්ෂණාගාර පහසුකම් බාහිරට ලබා දීම සහ එහි සමහර පරීක්ෂණාගාර විශ්ලේෂණයන් සඳහා ප්‍රතීතනය ලබා ගැනීම ආරම්භ කර ඇත. ධාන්‍ය ගබඩා ධූමායනය කිරීම පරීක්ෂණාගාර සේවා හරහා පාර්ශ්වකරුවන්ට ලබා දෙන තවත් ප්‍රවර්ධන පහසුකමකි. 2021 වර්ෂය තුළ ඔවුන්ගේ ආහාර නියැදි විශ්ලේෂණය කිරීමෙන් පසු පාර්ශ්වකරුවන් වෙත පරීක්ෂණාගාර වාර්තා 351 ක් නිකුත් කර ඇත. තවද, ධූමායනය කිරීම් 5 ක් සිදු කරන ලදී.



පරීක්ෂණාගාර පහසුකම්

## ධාරිතාවය ගොඩනැංවීම සහ ඵලදායිතා වර්ධනය

සේවකයන්ගේ දැනුම වැඩිදියුණු කිරීම සඳහා ආයතනය මහත් උනන්දුවෙන් කටයුතු කරයි. 2021 වර්ෂය තුළ ආයතනයේ පහත නම් සඳහන් නිලධාරීන් පසු අස්වනු තාක්ෂණය හා සම්බන්ධ ක්ෂේත්‍රවල පශ්චාත් උපාධි අධ්‍යයන සහ පුහුණුවීම් ලබා ඇත.

**පශ්චාත් උපාධි වැඩසටහන්**

**සම්පූර්ණ කර ඇති වැඩසටහන්**

බී. ඒ. එම්. එස්. කුමාර මහතා
උද්‍යාන විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය
කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය (PGIA)
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ආර්.එම්.ආර්.එන්. කේ රත්නායක මිය
පසු අස්වනු තාක්ෂණය පිළිබඳ ආචාර්ය උපාධිය
විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIS)
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ඉංජි. ඩී.එම්.එස්.පී. බණ්ඩාර මිය
ජීව පද්ධති ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය
කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය (PGIA)
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**සිදු කරමින් පවතින වැඩසටහන්**

ඩබ්ලිව්.එම්.සී.බී.වාසල මහතා
පසු අස්වනු තාක්ෂණය පිළිබඳ ආචාර්ය උපාධිය
කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය (PGIA)
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ඉංජි. ඩී.එම්.එස්.පී. බණ්ඩාර මිය
ජීව පද්ධති ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය
කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය (PGIA)
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

සී.කේ.මාරසිංහ මිය
ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය
ඉංජිනේරු පර්යේෂණ සහ පශ්චාත් උපාධි අධ්‍යයන මධ්‍යස්ථානය
ඉංජිනේරු පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ

එස්.එස්.කේ.වීරසිංහ මෙනවිය
උද්‍යාන විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය
කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය (PGIA)
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ඩබ්ලිව්.බී.ඩබ්ලිව්.එම්.ආර්.සී.පී මිය. අලුවිහාරේ මිය
උද්‍යාන විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය
කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය (PGIA)
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**කෙටි කාලීන පුහුණු/රැස්වීම්/සම්මන්ත්‍රණ**

කොවිඩ්-19 වසංගත තත්ත්වය යටතේ විදේශීය පුහුණුවීම්වලට සහභාගී වීමට නොහැකි වූ බැවින් පර්යේෂණ සහ සංවර්ධන කාර්ය මණ්ඩලය අතථ්‍ය වේදිකාවක පවත්වනු ලබන පුහුණු වැඩසටහන්/වැඩමුළු සඳහා සහභාගී වූහ. විස්තර පහත ලැයිස්තුගත කර ඇත.

| වැඩසටහනේ නම | සහභාගිවූවන් සංඛ්‍යාව | වැඩසටහනේ කාලසීමාව |
|---|---|---|
| පරීක්ෂණාගාරවල තත්ත්ව කළමනාකරණ පද්ධති පිළිබඳ අභ්‍යන්තර විගණනය | 02 | දින 2 |
| පරීක්ෂණාගාර තත්ත්ව පාලනයට අදාළ ප්‍රමිතීන් හඳුනා ගැනීම | 03 | පැය 3 |
| ක්ෂුද්‍රජීව විද්‍යාගාරවල තත්ත්ව පාලනය | 03 | පැය 2 |
| පරීක්ෂණාගාර මිනුම්වල අවිනිශ්චිතතාවය තක්සේරු කිරීම | 03 | දින 2 |
| ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක කියවීම්වල අවිනිශ්චිතතාවය තක්සේරු කිරීම | 03 | දින 2 |

| | | |
|---|---|---|
| නියැදි පරීක්ෂණ රසායනාගාර සඳහා ක්‍රමාංකන සහතිකය | 03 | පැය 3 |
| ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ පුහුණු වැඩසටහන | 03 | පැය 2 |
| නියැදි පරීක්ෂණ රසායනාගාර සඳහා පාලක නියැදි හඳුනාගැනීම | 03 | දින 1 |
| පරීක්ෂණාගාරයක අපද්‍රව්‍ය කළමනාකරණය | 2 | දින 1 |
| ඌන උපයෝජිත භෝග සඳහා අගය එකතු කිරීම | 03 | පැය 3 |
| ආහාර ඇසුරුම්කරණය | 16 | දින 2 |
| පලතුරු සහ එළවළු සඳහා අගය එකතු කිරීම සහ පසු අස්වනු තාක්ෂණයන්හි නව ප්‍රවණතා | 12 | පැය 1.5 |
| ඔබේ වෘත්තිය ජය ගන්නේ කෙසේද යන්න පිළිබඳ දැනුම්වත් කිරීම | 16 | පැය 2 |
| "කුඩා පරිමාණ ව්‍යවසායකයින් සඳහා නව්‍ය අලෙවිකරණ ආකෘති" පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන | 1 | පැය 5 |

## සම්මාන සහ පිළිගැනීම්

**ඉංජි. එච්.එම්.ජේ.පී. රත්නායක මහතා**

- පීඨ මණ්ඩල සාමාජික, කෘෂිකර්ම පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
- කෘෂිකර්ම ශාස්ත්‍රපති උපාධි වැඩසටහනේ අධ්‍යයන මණ්ඩල සාමාජික, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

**ආචාර්ය නිලන්ති විජේවර්ධන මිය**

- ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ (SLAAS) මෙහෙයුම් කමිටු සාමාජික
- ගස්ලබු සඳහා ප්‍රමිති සම්පාදනය කිරීම සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ කෘත්‍යාධිකාරි කමිටුවේ සාමාජික
- සභාපති, SLAAS හි පරිසර කමිටුව
- ශ්‍රී ලංකා පරිසර අමාත්‍යාංශයේ, දේශගුණික විපර්යාස ලේකම් කාර්යාලයේ ජාතික වශයෙන් නිශ්චය කළ දායකත්වයන් (NDCs) සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම සඳහා කෘෂිකර්ම සහ පශු සම්පත් අංශය පිළිබඳ උපදේශක

**ඩබ්ලිව්.එම්.සී.බී. වාසල මහතා**

- සාමාජික, ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් සම්බන්ධීකරණය කරන ලද පසු අස්වනු තාක්ෂණය පිළිබඳ ජාතික කමිටුව
- සාමාජික, වී සහ සහල් ගබඩා කිරීම සඳහා ක්‍රියාකාරි මණ්ඩලය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

**ආචාර්ය ආර්.එම.ආර්.එන්.කේ. රත්නායක මහතා**

- ලේකම්, දිලීර විද්‍යාව සහ ශාක ව්‍යාධි විද්‍යාව පිළිබඳ ශ්‍රී ලංකා සංගමය

## ප්‍රකාශන

- අලුවිහාරේ, ඩබ්ලිව්.බී.ඩබ්ලිව්.එම්.ආර්.සී.පී., විජේවර්ධන ආර්.එම්.එන්.ඒ. (2021) කැපූ මල්වල කල් තබා ගත හැකි ආයු කාලය සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා භාවිතා කිරීමට සුදානම් සංයෝගයක් සංවර්ධනය කිරීම, 2021 දෙසැම්බර් 16 වැනි දින සූම් තාක්ෂණය ඔස්සේ මල් වගා පර්යේෂණ පිළිබඳ ජාතික සම්මන්ත්‍රණයේ (NaSFLOR) ඉදිරිපත් කරන ලද පත්‍රිකාව

- ද සොයිසා, පී.එන්.ටී., එච්.පී.එස්., සෙනරත්, සහ විජේවර්ධන, ආර්.එම්.එන්.ඒ.. ආහාර ද්‍රව්‍යයක් ලෙස පිටි සකස් කිරීම සඳහා ඇඹුල් කෙසෙල් (Musa spp.) ප්‍රභේදය භාවිතා කිරීම. (2021) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර පර්යේෂණ සැසිවල කාර්ය සටහන් 2021, ශ්‍රී ලංකාව, වෙළුම 23. 2021 නොවැම්බර් 23, 11 සහ 12.

- ගුණවර්ධන, ඊ., රත්නායක, ආර්.එම්.ආර්.එන්. ජයතුංග, කේ.ජී.එල්.ආර්. සහ ඉලේපෙරුම, සී.කේ. (2021), අමු මිරිස් (*Capsicum annuum* L.) පසු අස්වනු ගුණාත්මකභාවය මත දහයියා අළු පෙර අස්වනු සමයේ පසට යෙදීමෙහි බලපෑම. නවෝත්පාදන සහ මතුව එන තාක්ෂණයන් පිළිබඳ ජාත්‍යන්තර සමුළුවේ කාර්ය සටහන්. 2021 නොවැම්බර් 25-26, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

- හේරත්, එච්.එම්.බී.එච්., බණ්ඩාර, ඩී.එම්.එස්.පී.,.වීරසූරිය, ජී.වී.ටී.වී., කොස්ගොල්ලේගෙදර, ඊ.ජේ. කාර්තිගයිනි, එස්., විජේතුංග, ජී.ඒ.එම්.ඒ.. සහ මාරසිංහ, සී.කේ. (2021), විදුලි බලයෙන් ක්‍රියාත්මක වන රටකජු පොතු ඉවත් කිරීමේ යන්ත්‍රයක කාර්ය සාධනය ඇගයීම. ජාතික ඉංජිනේරු පර්යේෂණ සම්මන්ත්‍රණයේ කාර්ය සටහන් (NERS_2021)

- හෙට්ටිගේ කේ.ඩී.ටී. *Lactobacillus acidophilus* යොදා පැසවන ලද කටු අනෝදා අන්තර්ගත ප්‍රිබයෝටික් ශීත කළ යෝගට් සකස් කිරීම. (2021) ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 5 වැනි ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව පිළිබඳ ප්‍රකාශනය 2021

- ජයරත්න, ජී.ඊ.ඩී.ඒ.එම්, නවරත්න, එස්.බී., වික්‍රමසිංහ, අයි. (2021). පසු අස්වනු ගබඩා කිරීමේ පිළිවෙත් අනුගමනය කිරීමෙන් දේශීයව ලබා ගත හැකි තක්කාලිවල ලයිකොපීන් අන්තර්ගතය වැඩි දියුණු කිරීම. ආහාර විද්‍යා හා තාක්ෂණ දෙපාර්තමේන්තුව, ව්‍යවහාරික විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ, ශ්‍රී ලංකාව

- ජයසිංහ, ජේ.ඒ.එස්.ටී., කුමාර, බී.ඒ.එම්.එස්. සහ ජයතුංග, කේ.ජී.එල්.ආර්.. (2021). අලිගැටපේරවල ඉදීමේ වේගය වැඩි කිරීමට එතිලීන් සාන්ද්‍රණය සහ නිරාවරණ කාලය ප්‍රශස්ත කිරීම. වියළි කලාපීය කෘෂිකර්මය පිළිබඳ 7 වැනි ජාත්‍යන්තර සමුළුවේ කාර්ය සටහන්, 2021 දෙසැම්බර් 3 සහ 4, කෘෂිවිද්‍යා පීඨය, යාපනය විශ්වවිද්‍යාලය, කිලිනොච්චිය, ශ්‍රී ලංකාව

- කුමාර, බී.ඒ.එම්.එස්., විජේවර්ධන, ආර්.එම්.එන්.ඒ. සහ සමරසිංහ, වයි.එම්.පී. (2021) නැවුම් පලතුරු - (ගස්ලබු, පේර, අන්නාසි) කල් තබා ගැනීම සඳහා ශීත වියළීම සහ රික්තක ඇසුරුම් තාක්ෂණයේ කාර්යක්ෂමතාවය ඇගයීම. කෘෂිකාර්මික විද්‍යා සඟරාව - ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

- කුමාර, බී.ඒ.එම්.එස්., මැණිකේ, ජී.ඩී.එන්. සහ සමරසිංහ, වයි.එම්.පී. (2021) අනවශ්‍ය පසු අස්වනු භෞතික ක්‍රියාකාරකම් පාලනය කිරීම මඟින් නැවුම් පලා වර්ගවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම, වියළි කලාපීය කෘෂිකර්මය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය - යාපනය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

- කුමාර, බී.ඒ.එම්.එස්., විජේවර්ධන, ආර්.එම්.එන්.ඒ. සහ සමරසිංහ, වයි.එම්.පී. (2021) විජලනය කිරීම අතරතුර දුඹුරු පැහැ වීම වැළැක්වීම සඳහා නැවුම් කැපූ පේර පෙති සඳහා ප්‍රති-දුඹුරු ප්‍රතිකාරවල බලපෑම. *කෘෂිකාර්මික විද්‍යා සඟරාව - ශ්‍රී ලංකාව.* 16(1):28-36.http://doi.org/10.4038/jas.v16i1.9181

- කුමාර, බී.ඒ.එම්.එස්., මැණිකේ, ජී.ඩී.එන්. සහ සමරසිංහ, වයි.එම්.පී. (2021) නවීකරණය කරන ලද වායුගෝලීය ඇසුරුම් (MAP) Sesbania Grandiflora (L.) නැවුම් කතුරු මුරුංගා පත්‍රවල පසු අස්වනු කාලය දීර්ඝ කරයි. වියළි කලාපීය කෘෂිකර්මය පිළිබඳ 7 වැනි ජාත්‍යන්තර සමුළුවේ කාර්ය සටහන්, 2021 දෙසැම්බර් 3 සහ 4, කෘෂිවිද්‍යා පීඨය, යාපනය විශ්වවිද්‍යාලය, කිලිනොච්චිය, ශ්‍රී ලංකාව

- ලයනල්, යූ.පී.එල්.එම්., විජේවර්ධන, ආර්.එම්.එන්.ඒ., ආරච්චි, එම්.පී.එම්. සහ එන්.ඊ. වෙදමුල්ල.(2021) අලිගැටපේර (*Persea americana*) ආශ්‍රිත පෝෂණීය අතිරේක ආහාරයක් සංවර්ධනය කිරීම සහ තත්ත්ව ඇගයීම. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 5 වැනි ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව, IRCUWU2021 "අභියෝගාත්මක කාලපරිච්ඡේදවල විභවයන් ගවේෂණය කිරීම" ජූලි 1 – 2, 2021, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, බදුල්ල, ශ්‍රී ලංකාව. පත්‍රිකාව ID: IRCUWU2021-488

- විජේවර්ධන, ආර්.එම්.එන්.ඒ.,.ජයවීර, ජේ.ඒ.එස්. සහ පෙරේරා, ජී.ඒ.ඒ.ආර්., (2021). පලතුරු සහ එළවළු පදනම් කරගත් ශක්තිජනක පානයක් සැකසීම සහ තත්ත්ව ඇගයීම. ව්‍යවහාරික සහ ශුද්ධ විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය 2021, විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව


**<u>පේටන්ට් බලපත් සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත් 2021</u>**

නම: ජී.ඊ.ඩී.ඒ.එම්. ජයරත්න
තේමාව: සාදික්කා (*Myristica sp.*) සහ කුරුඳු (*Cinnamon zeylanicum*) තෙල් නිස්සාරණයන් ඇතුළත් කිරීමෙන් ආහාර කල් තබා ගැනීම සඳහා ආහාර ආකලනයක් සංවර්ධනය කිරීම

ඉල්ලුම් කරන ලද දිනය: 2020.07.31 (මෙ දක්වා සලකා බලමින් පවතී)

## සමාජ, සුභසාධන සහ ආගමික ක්‍රියාකාරකම්

2021 වර්ෂයේදී කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ආයතනයට සමාජ, සුබසාධන සහ ආගමික කටයුතු සිදුකිරීමට නොහැකි විය.

## මානව සම්පත්

ආයතනයේ සම්පූර්ණ ස්ථිර කාර්ය මණ්ඩලය 155කි. 2021 දෙසැම්බර් මාසය අවසන් වනවිට සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව 118කි. මෙම එකතුව තාක්ෂණික අංශවලින් 52%කින් සහ සහායක අංශවල 48%කින් සමන්විත විය

2020 දෙසැම්බර් 31 දිනට

| **තනතුර** | **මුළු සේවක සංඛ්‍යාව** | **වර්තමාන සේවක සංඛ්‍යාව** |
|---|---|---|
| **ඉහළ කළමනාකරණ තනතුරු** | | |
| අධ්‍යක්ෂ | 01 | - |
| අතිරේක අධ්‍යක්ෂ (පරිපාලන සහ මූල්‍ය) | 01 | 01 |
| අතිරේක අධ්‍යක්ෂ (පර්යේෂණ සහ තාක්ෂණ පැවරීම්) | 01 | 01 |
| **එකතුව** | **03** | **02** |
| **පර්යේෂණ සහ සංවර්ධන කාර්ය මණ්ඩලය** | | |
| ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු | 01 | 01 |
| ප්‍රධාන පර්යේෂණ නිලධාරි | 02 | 02 |
| ප්‍රධාන ව්‍යාප්ති නිලධාරි | 01 | - |
| ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි | 03 | 02 |
| ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික ඉංජිනේරු | 02 | 02 |
| ජ්‍යෙෂ්ඨ ව්‍යාප්ති නිලධාරි | 01 | - |
| පර්යේෂණ නිලධාරි | 14 | 11 |
| යාන්ත්‍රික ඉංජිනේරු | 06 | 03 |
| ව්‍යාප්ති නිලධාරි | 05 | 05 |
| ආර්ථික විද්‍යාඥ | 01 | 01 |
| **එකතුව** | **36** | **27** |

**සහායක කාර්ය මණ්ඩලය**

| **තනතුර** | **මුළු සේවක සංඛ්‍යාව** | **වර්තමාන සේවක සංඛ්‍යාව** |
|---|---|---|
| අභ්‍යන්තර විගණක/ජ්‍යෙෂ්ඨ අභ්‍යන්තර විගණක | 01 | 01 |
| ගණකාධිකාරි ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි | 01 | 01 |
| තාක්ෂණ නිලධාරි (විද්‍යාගාර) | 01 | 01 |
| පරිපාලන නිලධාරි | 02 | 02 |
| පුස්තකාලයාධිපති/ප්‍රකාශන නිලධාරි | 01 | 01 |
| ව්‍යාප්ති සහායක | 10 | 10 |
| සැලසුම්කරු | 01 | 01 |
| තාක්ෂණ සහායක | 03 | 02 |
| තාක්ෂණ සහායක (සිවිල්) | 01 | 01 |
| කළමනාකාර සහායක (මුදල් අයකැමි) | 01 | 01 |
| කළමනාකාර සහායක | 27 | 26 |
| විද්‍යාගාර සහායක | 04 | 02 |
| උපකරණ ක්‍රියාකරු | 02 | 01 |
| රියදුරු | 13 | 12 |
| විදුලි කාර්මික | 01 | - |
| පැස්සුම්කරු/ෆෝමන් | 01 | 01 |
| කාර්මික | 02 | 02 |
| මෝල/යන්ත්‍ර ක්‍රියාකරු | 03 | 03 |
| බොයිලේරු ක්‍රියාකරු | 02 | - |
| සූපවේදී | 01 | 01 |
| කාර්යාල සහායක | 18 | 20 |

| | | |
|---|---|---|
| බොයිලේරු සහායක | 01 | 01 |
| කම්කරු (සනීපාරක්ෂක) | 03 | 03 |
| කම්කරු (ආපන ශාලාව) | 02 | 02 |
| ආරක්ෂක නිලධාරි | 06 | 06 |
| නඩත්තු සහායක | 08 | 08 |
| **එකතුව** | **116** | **109** |

**පර්යේෂණ සහ තාක්ෂණ පැවරීම් කාර්ය මණ්ඩලයේ විශේෂඥතාවය**

ආයතනය සතුව පසු අස්වනු තාක්ෂණ ක්ෂේත්‍රයේ, සහල් සැකසුම්, ධාන්‍ය ගබඩා කිරීම පිළිබඳව මනා විශේෂඥතාවයක් පවතින අතර පලතුරු, එළවළු සහ කුළුබඩු පිළිබඳව සැලකිය යුතු විශේෂඥතාවයක් පවතී. පර්යේෂණ හා තාක්ෂණික කාර්ය මණ්ඩලය ඉංජිනේරුවන්, කෘෂි විද්‍යාඥයන්, රසායන විද්‍යාඥයන්, ක්ෂුද්‍ර ජීව විද්‍යාඥයන් සහ ආහාර විද්‍යාඥයන්ගෙන් සමන්විත වේ. විවිධ ක්ෂේත්‍රවල ගැටලු විශ්ලේෂණය කිරීමට මෙය උපකාරි වේ.

**පර්යේෂණ හා සංවර්ධන නිලධාරින්ගේ ව්‍යාප්තිය**

| අංකය | ප්‍රදේශය | පුරුෂ | කාන්තා | එකතුව |
|---|---|---|---|---|
| 01 | කෘෂිකර්ම | 07 | 11 | 18 |
| 02 | ඉංජිනේරු | 03 | 03 | 06 |
| 03 | විද්‍යා | 01 | 01 | 02 |
| 04 | ආහාර විද්‍යා | - | 01 | 01 |
| 05 | **එකතුව** | **11** | **16** | **27** |

# විධායක කාර්ය මණ්ඩලය

2021 දෙසැම්බර් 31 වැනි දිනට

**අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි (වැඩබලන)**
ඉංජි. එච්.එම්.ඒ.පී. රත්නායක මයා
*BSc. Eng, MEng. CEng.MIE (SL)*

**අතිරේක අධ්‍යක්ෂ (පර්යේෂණ සහ තාක්ෂණ පැවරීම්)**
ඉංජි. එච්.එම්.ඒ.පී. රත්නායක මයා
*BSc. Eng, MEng. CEng.MIE (SL)*

**අතිරේක අධ්‍යක්ෂ (පරිපාලන සහ මූල්‍ය)**
ආර්.කේ.ඒ.පී. රාමනායක මයා
*BSc. Mgt. Licentiate Certificate, ICA, MIPFDA*

**පර්යේෂණ අංශය**
**අංශ ප්‍රධානී | ප්‍රධාන පර්යේෂණ නිලධාරි**
ආචාර්ය නිලන්ති විජේවර්ධන මිය
*BSc. Agric, MSc. Agric, MPhil, PhD*

**පර්යේෂණ නිලධාරින්**

වයි.එම්.පී. සමරසිංහ මිය
*B.Sc. Agric. MSc in Geo Informatics*

බී.ඒ.එම්.එස්. කුමාර මයා
*B.Sc. Agric. M.Sc.(Organizational Management)*

ටී.එම්.ඒ.එන්. වීරසිංහ මෙනෙවිය
*B.Sc. in Export Agriculture (special),M.Sc. in Food Science & Technology*

ජී.ඊ.ඩී.ඒ.එම්. ජයරත්න මෙනෙවිය
*B.Sc. Food Science & Tech. (special),M.Sc. in Food Science and Nutrition*

ඩබ්ලිව්.එම්.එස්.එස්.කේ. වීරසිංහ මෙනෙවිය
*B.Sc. Agric. M.Sc. in Organizational Management*

ඩබ්ලිව්.බී.ඩබ්ලිව්.එම්.ආර්.සී.පී. අලුවිහාරේ මිය
*B.Sc. Agric. MSc in Horticulture (Reading)*

කේ.ඩී.ටී. හෙට්ටිගේ මයා
*B.Sc. Agric., M.Sc. in Food and Nutrition*

ජී.ඩී.එන්. මැණිකේ මිය
*B.Sc. Agric. M.Phil. in Molecular and Applied Microbiology(Plant Protection)*

## ඉංජිනේරු අංශය

**අංශ ප්‍රධානි | ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික ඉංජිනේරු (වැඩබලන)**
ඉංජි. බී.ඩී.එම්.පී. බණ්ඩාර මයා
*BSc. Eng, MEng. CEng. MIE (SL)*

**ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු**
ඩී.පී. සේනානායක මිය
*BSc. Eng, MPhil. CEng. MIE (SL)*

***යාන්ත්‍රික ඉංජිනේරුවන්***
සී.කේ. මාරසිංහ මිය
*B.Sc. Eng., M.Phil.(Eng.), AMIE (SL), Ph.D.(Reading)*

වී.ජී.කේ. මධුරංග මයා
*B.Sc. Eng.*

## ව්‍යාප්ති අංශය

**අංශ ප්‍රධානි | ජ්‍යෙෂ්ඨ ව්‍යාප්ති නිලධාරි**
ඩබ්ලිව්.එම්.සී.බී. වාසල මයා
*BSc. Agric, MSc. Agric, MPhil.*

**ව්‍යාප්ති නිලධාරි**
පී.ජී. ලලිත් වසන්ත මයා
*B.Sc. Agric., MSc Agric.*

එම්.එම්. හේරත් මයා
*B.Sc Agric., Dip. in Counseling*
*Ph.D.( Reading)*

එන්. සෝමකාන්තන් මයා
*B.Sc Agric., MSc Agric.*

ලක්මිණි සෙනෙවිරත්න මෙනෙවිය
*B.Sc Agric.,*

**ව්‍යාපෘති කළමනාකරණ අංශය**

**අංශ ප්‍රධානී | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි**
ඩබ්ලිව්.එම්.සී.බී. වාසල මයා
*BSc. Agric, MSc. Agric, MPhil. Ph.D. (Reading)*

**පරීක්ෂණාගාර සේවා අංශය**

**අංශ ප්‍රධානී | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි (වැඩබලන)**
චමින්ද ගුණවර්ධන මයා
*BSc (Chemistry) special.*

**තාක්ෂණික නිලධාරි**
චම්පික කුමාර මයා
*NCT (Electrical)*

**සැලසුම් සහ අධීක්ෂණ අංශය**

**අංශ ප්‍රධානී | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි**
ආචාර්ය රුවන්කා රත්නායක මිය
*BSc.Sp. (Botany), MSc., PhD (Reading)*

**ආර්ථික විද්‍යාඥ**
කේ.ඒ.ටී.එස්. කුමාරි මෙනෙවිය
*BSc. Agric, MSc (Reading)*

**පරිපාලන අංශය**

**අංශ ප්‍රධානී | අතිරේක අධ්‍යක්ෂ (පරිපාලන සහ මූල්‍ය)**
ආර්.කේ.ඒ.පී. රාමනායක මයා
*BSc. Mgt.Licentiate Certificate, ICA, MIPFDA*

**පරිපාලන නිලධාරි**

ජානක සුබසිංහ මයා

*BSc.*

**පරිපාලන නිලධාරි**

ඩී.එන්. මුණසිංහ මිය

## මූල්‍ය අංශය

**අංශ ප්‍රධානී | ගණකාධිකාරි**

අයි.එම්.එන්.පී. ඉලංගසිංහ මයා
*B.Com (Sp.), APFA, ACPM, MBA (Reading)*

## ශාස්ත්‍රීය අංශය

**ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික ඉංජිනේරු (වැඩබලන)**

ආචාර්ය ඩී.එම්.එස්.පී. බණ්ඩාර මිය
*BSc. Eng, MPhil. CEng.MIE (SL) Ph.D. (Reading)*

## අභ්‍යන්තර විගණන අංශය

**අංශ ප්‍රධානී | අභ්‍යන්තර විගණක**

ආර්.එම්.ඩී. රත්නායක මයා
*BSc (Accounting)*